## ග්‍රාමීය මහජන පුස්තකාල හා ප්‍රජා සමූහ රටාව.

සිරිපාල දොඩාවත්ත විසිනි.*

ග්‍රාමීය සමාජ රටාවක් තුල වෙසෙන ප්‍රජා සමූහයක් ඒක රාශී කරන ආයතනයක් ලෙස ග්‍රාමීය මහජන පුස්තකාලය හැඳින්විය හැක. ගමේ පන්සල, පාසැල, ආරෝග්‍යශාලාව, සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලය, ග්‍රාම සංවර්ධන සමිතිය වැනි ආයතන මඟින් ද ප්‍රජා සමූහ ඒක රාශී කරන බව සැබෑ ය. ඒ එක් එක් ආයතන මඟින් ඊට අනුකූල වූ කාර්යයක් සිදු කෙරේ. ගමක ප්‍රජා සමූහ මධ්‍යස්ථානයත් (Community Centre), ග්‍රාමීය මහජන පුස්තකාලයත් ප්‍රජා සමූහ ඒක රාශී කිරීමට උත්සාහ කරන්නේ ඉහත කී ආයතන වලින් අපේක්ෂිත පරමාර්ථයන්ට වඩා වෙනස් අරමුණක් ඇතිවයි. ගමක උසස් පරමාර්ථයකින් පවත්වා ගෙන එන ප්‍රජා සමූහ මධ්‍යස්ථානයක් කිසිසේත් නොදියුණු තත්ත්වයක නො තිබෙයි. එවැනි ප්‍රජා සමූහ මධ්‍යස්ථානයක උණුසුම් ක්‍රියාකාරීත්වයක් නිතර දක්නට ලැබෙයි. ඒ නිසාම එහි සාමාජිකයින්ට ගොඩනැගිල්ලක්, ක්‍රීඩා භාණ්ඩ, ගෘහ උපකරණ, පොත්පත් හා දිනපතා පුවත් පත් සඟරා කීපයක් හෝ ලබා ගැනීමට හැකියාවක් ඇති වෙයි. ග්‍රාමීය ප්‍රජා සමූහ මධ්‍යස්ථානයක් තුල ග්‍රාමීය මහජන පුස්තකාලයක ලක්ෂණ කීපයක් දකින්න ලැබුනත් සම්පූර්ණ සමභාවයක් එහි නැත. බොහෝ විට මෙවැනි ප්‍රජා සමූහ මධ්‍යස්ථානයක සිදු වන්නේ ශ්‍රමදාන, ක්‍රීඩා කටයුතු ආශ්‍රයෙන් අනුන්ට උපකාර කිරීම, පොදු සමාජ සංවර්ධන වැඩ, සුහදතාවත් පැතිරවීම, ඉවසීම වැනි අපේක්ෂාවන් උත්කෘෂ්ට කිරීම යි. ඇමරිකාවේ නම් ග්‍රාමීය පුස්තකාලයත්, ග්‍රාමීය ප්‍රජා සමූහ මධ්‍යස්ථානයත් අතර දැඩි සම්බන්ධතාවක් දක්නට ලැබෙයි.

"..... ඔවුන්ගේ පුස්තකාලය පොත් පත් කියවීමට ලබා ගත හැකි තැනක් පමණක් නොවේ. ගමේ හෝ නගරයේ හෝ ප්‍රජා කටයුතු වලට මූලික මධ්‍යස්ථානය එය යි.

කුඩා ළමයින් පින්තූර පොත් බලන්නත් කථාන්තර වලට සවන් දීමට ත් එහි පැමිණෙති. කථාන්තර පැය ඔවුන් අතර ඉතා ජනප්‍රිය ය. මේ අතර පාසැල් පාඩම් වලට අවශ්‍ය වැඩි විස්තර පොත් පත් වලින් බලා ගැනීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවෝ පැමිණෙති. තමන් විසින් ඇඳිනු ලබන චිත්‍රයන් අනෙක් අයටත් බලා රස විඳ ගැනීමට සැලැස්වීම සඳහා එහි එන චිත්‍ර ශිල්පීහු ඒවා ප්‍රදර්ශනයන් සේ පිළියෙළ කරති. වැඩිහිටියෝ පුස්තකාලයේ ශාලාවන් ප්‍රජා මණ්ඩලයක් සේ පාවිච්චි කරති. රැස්වීම් පැවැත්වීම, නොයෙක් කටයුතු ගැන සාකච්ඡා පැවැත්වීම ආදිය එහි සිදු කෙරේ. මල් සකස් කිරීම් ආදිය ට ගමේ උද්‍යාන ආදිය ගැන පුහුණුවක් ඇත්තෝ පැමිණෙති. අවසේ ඒ ඒ අවස්ථාවන්හි දී මෙසේ පුස්තකාලයට පැමිණෙන සියලු දෙනාම ආපසු ගෙදර යන්නේ කියවීමට පොතක් හෝ දෙකක් ද රැගෙන ය."

ගමේ පුස්තකාලය, ගමේ මිනිසුන්ගේ කායික මානසික සංවර්ධනය එක සේ අගය කරන ආයතනයකි. කියවීම හා විමර්ශනය ඔස්සේ අකුරු උගත් පුද්ගලයා අළුත් අවබෝධයන් කරා පොළඹවයි. අකුරු උගතාත්-නූගතාත් ඇසීම්, දැකීම් (Audio-visual) මාධ්‍ය ආශ්‍රයෙන් අළුත් අවබෝධයන් කරා පොළඹවීමට ඊට හැකියාවක් ඇත. ග්‍රාමීය මහජන පුස්තකාලයත්, ගැමි ප්‍රජා සමූහයත් අතර අධ්‍යාපනික හා සංස්කෘතික කේන්ද්‍රස්ථානයක් ලෙස පිළි ගැනීමට හැකි වන්නේ මේ හේතුවෙනි.

---

* ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ උපාධිධාරියකු වන සිරිපාල දොඩාවත්ත, දැනට බදුල්ල බහුතාක්ෂණික ආයතන යේ පුස්තකාලයාධිපතිවරයා ය.

එකාකාර පැවැත්මකින් ගලා බසිනා ගමක් පොදු සංවර්ධනය අරභයා සසල කිරීමට සංවිධානාත්මක ග්‍රාමීය පුස්තකාලයකට හැකි වෙයි. සමාජය මොහොතින් මොහොත සසල කිරීමෙන් ඒ වටා පෙරවා ඇති උදාසීනතාවය බිඳී යයි. පොදු අධ්‍යාපනික හා සංස්කෘතික වැඩ සටහන් හා ආර්ථික දියුණුවට හිතකර අලුත් අවබෝධයන් ව්‍යාප්ත කිරීමෙන් ගමක, සමාජයක නිරන්තර ගතිශීලතාවක් ඇති කළ හැක. අලුත් සාර ධර්මයන් මෙන්ම අතීතයෙන් උකහා ගත් දේ මත සිට අලුත් යමක් කරන ගැමියෙකුට අවශ්‍ය ධෛර්ය දීමට නම් හැම කෙනෙකු තුළ ඒ පිළිබඳ අවබෝධයක් දැනුමක් ඇති විය යුතුයි. ග්‍රාමීය මහජන පුස්තකාලයක් අර්ථාන්විත වන්නේ මේ අධ්‍යාපනික හා සංස්කෘතික කාර්යයේ නියමුවා එයම වන බැවිනි.

ග්‍රාමීය ප්‍රජා සමූහ සංවර්ධන සැලැස්මක් තුළ ග්‍රාමීය පුස්තකාලයකට හිමි වන අද්විතීය තැන ගැන අවබෝධයක් ලබා ගැනීමට හැකි වූයේ ඉතා මෑත කාලයේ දී ය. විශේෂයෙන් එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික හා විද්‍යාත්මක සංවිධානය, ඇමෙරිකානු පුස්තකාල සංගමය, බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාල සංගමය හා ප්‍රජා සමූහ දියුණු කිරීමේ ශුභ සාධක වැඩ සටහන් සංවිධානය කළ වෙනත් සමාජවාදී රටවල ද කරන ලද විධිමත් පර්යේෂණ හා සමීක්ෂණවල ප්‍රතිඵලයක් වශයෙන් ග්‍රාමීය ප්‍රජා සංවර්ධන වැඩ පිළිවෙළ තුළ ග්‍රාමීය පුස්තකාලයට වැදගත් මෙහෙයක් ඉටු කළ හැකි බව පෙනී ගියේ ය. තමා කරන රක්ෂාව, වඩාත් හොඳින් කිරීමට අවශ්‍ය අවබෝධය ලබා දෙන විධියේ පොත් පත් පරිශීලනය, චිත්‍රපට, දේශන වලට සහභාගි කරවීම, සාමාජික ප්‍රශ්න සැපයීම කර ගැනීමට අවශ්‍ය දැනුම, ප්‍රශ්න හමුවේ පවුල් ජීවිතය ප්‍රීතිමත් ලෙස ගෙන යාමට අවශ්‍ය ශක්තිය පිළිබඳව මානසික විප්ලවයක් පුද්ගලයා තුළ ඇති කිරීමට ග්‍රාමීය පුස්තකාල සැලැස්මකට හැකියාවක් ඇති බව මෙම පර්යේෂණවලම හසු විය. මෑත භාගයේ දී ඌන - සංවර්ධිත රටවල ආර්ථික හා ප්‍රජා සංවර්ධන කටයුතු සම්බන්ධව පවත්වන ලද සම්මේලන වාර රැසකට ම සමාජ විද්‍යාඥයින්, අර්ථශාස්ත්‍රඥයින් පමණක් නොව පුස්තකාල විශේෂඥයින් හා පුස්තකාලයාධිපතිවරු ද සහභාගි කරවා ගෙන ඇත්තේ මේ හේතුවෙනි.

සමාජය පුද්ගලයින් දෙදෙනකුට වඩා වැඩි පිරිසක ගේ අන්‍යෝන්‍ය අදහස් හුවමාරු මත සැදුනේ වෙයි. ළමයින්, යෞවනයින් හා වැඩිහිටියන් වශයෙනුත්, අධ්‍යාපන, වෘත්තීය ඥාතීත්වය හා වෙනත් සාමූහික සම්බන්ධතා වශයෙනුත් විවිධ ධර්මතා මත විහිදෙන හැසිරීම් පද්ධතියක් සමාජ ක්‍රියා තුළ අන්තර්ගත වෙයි. පාසැල් සිසුන් සඳහා යි. වැඩි අධ්‍යාපනය ආතුරු නුගත් වැඩිහිටියන් සඳහා යි. ඒ ඒ ආයතන ඊට සම්බන්ධ පුද්ගලයින් සඳහා යි. පුස්තකාලය මේ සෑම ධර්මතාවකට නතුව ක්‍රියා කරන කෙබඳු කෙනෙකු වුවද සාමකාමීව හා අවබෝධයකින් එක් රැස් කරන පොදු අධ්‍යාපනික ආයතනය යි. මීට සමාන කාර්ය පද්ධතියක් සිදු කරන වෙනත් ආයතනයක් නැත. මෙහි ඇති තවත් වැදගත් ලක්ෂණයක් නම් මෙම ආයතනය තුල සමාජය ඒක රාශි කිරීමට ඇති පහසුව යි. ඇතැම් සමාජවල ග්‍රාමීය පාසැලට හෝ වැඩි අධ්‍යාපන පන්තිවලට පුද්ගලයන් කැඳවීම බොහෝ දුෂ්කරතාවක් වෙයි. එමෙන්ම වෙනත් ආර්ථික හා සෞඛ්‍ය උපදේශයන් සඳහා ප්‍රජා සමූහ ඒක රාශි කිරීම ද මහත් දුෂ්කරතා ඇති කරවයි. ප්‍රජා සමූහ සංවිධාන හෝ ශුභ සාධන මධ්‍යස්ථානවලට මේ ප්‍රශ්නයට නිරන්තරයෙන් ම මුහුණ පෑමට සිදු වෙයි. ටී.ආර්.බැට්න් විසින් ලියන ලද "ප්‍රජා සමූහ සහ ඔවුන්ගේ සංවර්ධනය" යන කෘතිය පුරා විහිදී යන අදහසක් නම්, නොදියුණු හා ඌන සංවර්ධිත ප්‍රදේශවල ජීවත් වන පුද්ගලයින් තුළ අලුත් යුගයේ ඇති වී ඇති වෙනස්වීම් දිරි ගැනීමට ඇති අපහසුවත්, අලුත් වෙනස්වීම් පිළිගැනීමෙන් ඇති වන දැඩි පහසුව අවබෝධ කිරීමට ඇති නොකැමැත්තත්, පාරම්පරික වශයෙන් පැවත එන දේ ඒ ආකාරයෙන් ම ක්‍රියාත්මක කිරීමට දක්වන කැමැත්තත් ය.[2]

---

බිත්තර වී ඉස ගොයම අස්වද්දනු වෙනුවට පැල සිටුවීමෙන් ගොයම වඩාත් සරු වන බව ගැමියාට අවබෝධ කිරීමට කලක් මෙරට ගොවිකම් නිලධාරීන්ට පැවති ප්‍රශ්නය සුළු උදාහරණයක් ලෙස ඉදිරිපත් කළ හැක. එහෙත් එය ඉතා ඉවසීමෙන් හා සාමාන්‍ය දෙයක් ලෙස ගැමියාට එක්ව පෙන්වා දීමෙන් පසු එය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට හැකි විය. මීට සමාන ප්‍රජා ගැටළු, ග්‍රාමීය පුස්තකාලයාධිකාරීන්ට ද මුහුණ පෑමට සිදු වන්නේ නැත්තේ නොවේ. ග්‍රාමීය මහජන පුස්තකාලයක් කෙතරම් අංග සම්පූර්ණ වුවද නොවුව ද ඒ කෙරෙහි ප්‍රජාව මෙහෙයවීමටත් එයින් උකහා ගත හැකි අර්ථාන්විත යමක් ඇති බව අවබෝධ කරවීමටත් පුස්තකාල පාලක මණ්ඩලවල උනන්දුවත් පුස්තකාලයාධිකාරීන්ගේ නිපුණතාවත් මත රැඳී පවතී. කෙතරම් ගැටළු හා දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදු වුවත්, අන් ආයතනවලට වඩා ග්‍රාමීය ප්‍රජාව කෙරෙහි යම් බලපෑමක් හෝ උනන්දුවක් ඇති කිරීමට ග්‍රාමීය පුස්තකාලවලට පහසු ය. එහෙත් බොහෝ ග්‍රාමීය පුස්තකාල, ප්‍රජාවෙන් ඈත් වූ වැඩි උනන්දුවක් දැක්වීමට තරම් ආයතනයක් නොවන සේ පෙනෙන්නට ඉඩ හැර ඇත්තේ ඒ පිළිබඳ නිපුණතාවයක් හෝ අවබෝධයක් නැති පුද්ගලයින් වෙතින් පාලනය වන්නක් බැවිනි.

ගමේ පුස්තකාලයක් තනා ඇත්තේ ගමේ මිනිසුන්ගේ කියවීම දියුණු කිරීමට බවත්, වහා ඒ තුළට පැමිණ කියවීම ආරම්භ කළ යුතු බවත් ප්‍රජාව හමුවෙහි විධාන කිරීමෙන් පුස්තකාල සඳහා ප්‍රජාව පෙළඹ විය නොහැක. එහෙත් මෙහි කිසියම් දෙයක් තිබිය හැකි බවත්, ඒ කුමක්දැ'යි සෙවීමට පොළඹ වන කුතුහලයක් ඇති කරවීමට පුස්තකාලවලට හැකියාවක් ඇත. නිහඬ, නිසසල ශාලාවක පුවත්පතක්, පොතක්, සඟරාවක් කියවන තමා වැනි පුද්ගලයෙකු දෙස බලන එවැනිම නවක යකුට මුල් නැනැත්තා ගේ ක්‍රියා කලාපය විමසීමේ කුතුහලය හට ගනියි. පුස්තකාල යේ බිත්තිවල සවි කළ පින්තූර රාමු තුළ ඇති සංස්කෘතික හා කලාත්මක චිත්‍ර, අධ්‍යාපනය, ආර්ථික ජීවිතය හා අලුත් නිපදවීම් පිළිබිඹු කරන ඡායාරූප, විවිධ දැන්වීම් ආදිය දකින විට ඒවා කුමක්දැ'යි කුමන කරුණක් නිසා එහි තබා ඇත්දැ'යි විමසීමට අකුරු නුගතෙකුට වුව ද ආශාවක් උපදී. පුස්තකාලයට ඒමට පුරුදු වූ අකුරු උගතාට ත් නුගතාට ත් ඇසීමට ඇති ප්‍රශ්න මහත් රාශියක් වෙයි. ගොවිකම් දෙපාර්තමේන්තුවේ අසුවල් වගා කටයුතු භාර නිලධාරියාගේ ලිපිනය කුමක් ද? අසුවල් වගාව සම්බන්ධව විමසිය යුත්තේ කාගෙන් ද? අසුවල් කර්මාන්තය ගැන ලියැවී ඇති පොත් පත් මොනවා ද? යන ඕනෑම ප්‍රශ්නයක් නැගීමට වැඩිහිටියකුට අවකාශ ඇත.

ප්‍රශ්න සඳහා වඩාත් පිළිතුරු සොයන්නේ කුඩා ළමයින්, ළමයින් හා යෞවනයන් ය. ළමා සාහිත්‍යයට හා ළමා අධ්‍යාපනයට අදාළ ප්‍රශ්න රාශියක් ඇසීමට ළමයින්ට ඇත. කුඩා අය පින්තූර පොත් බැලීමට හා ඒ වටා මනඃකල්පිත ලෝක මැවීමට දක්ෂ වන අතර වැඩුණු ළමයි, ළමා පත්‍ර සඟරා සහ කතාන්තර කියවීමට කැමැත්තක් දක්වති. පෙර මෙන් සුරඟනා කථාවලට වඩා සැබෑ පරිසරය තුළින් රචිත ජන කතන්දර හා විද්‍යාත්මක තොරතුරු කියවීමට වර්තමාන ළමා පරපුර දක්වන උනන්දුව අසීමිත බව විවිධ අත්දැකීම්වලින් අපට පෙනෙයි. ගුවන් ගැබ පීරා යන ජෙට් ගුවන් යානා, රොකට්, විශ්වයේ අසිරිමත් පුවත්, සඳ මත ගොඩ බට වීරයින් ගේ විද්‍යාත්මක තොරතුරු ඇසීමට නගර බද මෙන්ම ග්‍රාමීය පුස්තකාලයට එන ළමයින් ද එක සේ ඇල්මක් දැක් වූ බව කිව හැක.

පුස්තකාලයට එන යෞවනයන්ගේ ප්‍රශ්න මීට වඩා ගැඹුරු ය. තමා හදාරන විෂය ක්ෂේත්‍රයට අදාල දැනුම රැස් කිරීමේ පරමාර්ථයෙන් බාහිර පොත් පත් කියවීම ඔවුන්ට අවශ්‍ය වෙයි. ජීවිතයට බලපාන ගැඹුරු ප්‍රශ්න ද ඔවුන් අතරින් ගිලිහී නො වැටෙයි. සමාජය කලක් වැළඳ ගත්

---

සම්ප්‍රදායන් - සාර ධර්ම බිඳ දමා අළුත් අවශ්‍යතාවයන්ට අනුරූප සම්ප්‍රදායන් ගොඩ නැංවීමේ ආශාවන් බොහෝ යෞවනයන් තුල වෙයි. ඔවුහු ඊට අනුරූපතාවයක් දක්වන ලේඛකයන්, සමාජ විද්‍යාඥයන් හා මනෝ විද්‍යාඥයන් විසින් ලියන ලද විප්ලවකාරී පොත්පත් කියවීමට වැඩි උනන්දුවක් දක්වති. මේ හැම කෙනෙකුගේ ම අවශ්‍යතාවන් කෙරෙහි ඒකාකාර උනන්දුවක් දැක්වීමට පුස්තකාලයාධිපතිවරුන් ට සිදු වෙයි. එහෙත් මෙම අවශ්‍යතාවන් එක සේ අගය නො කිරීමෙන් හා එම අවශ්‍යතාවන් උත්කෘෂ්ට කිරීමේ අභිප්‍රායන් නොමැතිකම නිසා ඇතැම් ග්‍රාමීය පුස්තකාල සිහිසුන් වැදගැම්මකට නැති ආයතන බව ට පත් වී ඇත.

ලංකාව වැනි ඌන සංවර්ධිත රටක නගරබද සහ ග්‍රාමීය මහජන පුස්තකාල කෙරෙහි දක්වන සැලකිල්ල තවමත් සතුටුදායක නොවේ. නාගරික සහ ග්‍රාමීය මහජන පුස්තකාල පාලනය හා සංවිධානය පැවරී ඇත්තේ ඒ ඒ ප්‍රදේශ තුළ පිහිටි ගම්සභා, සුළු නගර සභා, නගර සභා හා මහනගර සභා ආයතනවලට යි. මෙවැනි බොහෝ ආයතන මගින් පාලනය වන ග්‍රාමීය මහජන පුස්තකාල කෙබඳු අරමුණක් කරා මෙහෙය විය යුතුදැ යි හරිහැටි අවබෝධ කර ගෙන ඇති බවක් නො පෙනෙයි. පුස්තකාල පිළිබඳව ක්‍රියාත්මක කළ යුතු පොදු මූල ධර්ම විශේෂයක් නොමැතිකම නිසා ක්‍රමානුකූල පොදු සැලැස්මක් දක්නට නො ලැබෙයි. පුස්තකාල පොදු මූල ධර්ම සමූහයක් යටතේ සංවිධානය කිරීම අත්‍යාවශ්‍ය වෙයි. එම පොදු මූල ධර්ම නිපදවීමට පුස්තකාල විද්‍යාව හා සේවාව මෙන්ම විවිධ ප්‍රාදේශීය සමාජ රටාවන් පිළිබඳව ගැඹුරු අවබෝධයකින් කළ යුත්තක් වෙයි. එමෙන් ම ඒ ඒ නාගරික හා ග්‍රාමීය පුස්තකාලවලට කැපී පෙනෙන පෞද්ගලිකත්වයක් ඇති කර ගැනීමට නිදහසක් දීම ද අනිවාර්ය විය යුතු යි.

බොහෝ ග්‍රාමීය මහජන පුස්තකාල පිළිබඳව බලපාන කරුණක් නම් ගොඩනැගිලි ප්‍රශ්නය යි. ඇමරිකාවේ ග්‍රාමීය ජනපදවල පුස්තකාල ගොඩනැගිලි, ගෘහ භාණ්ඩ හා වෙනත් උපකරණ තනා ගන්නේ ඒ ඒ ප්‍රදේශවල ජීවත්වන ජනතාවම යි. පුස්තකාලයකට අවශ්‍ය ආකෘතියකට අනුව තනන මෙම ගොඩනැගිලි පසු කලක දි රජයේ පාලනයට භාර දෙනු ලැබේ.[3] ලංකාවේ නම් මේ තත්ත්වය දුර්ලභ බොහෝ විට පළාත් පාලන නිර්මාණ අංශය විසින් පිළියෙළ කරනු ලබන සැලසුම් වලට අනුව ඒ ඒ පළාත් පාලන බල මණ්ඩල මගින් පුස්තකාල ගොඩනැගිලි ඉදි කරති. බොහෝ විට එම බල මණ්ඩල කාර්යාලය, නගර ශාලාව හා පුස්තකාලය එකිනෙකට සම්බන්ධව නිර්මාණය කෙරේ. මේ හැර පුස්තකාල ගොඩනැගිල්ලක අගය වටහා නො ගන්නා ආයතන ද තිබේ. එවැනි ආයතන මගින් පුස්තකාලයක් පවත්වා ගෙන යන්නේ කුඩා කඩ කාමරයක් වැනි තැනක ය. නැති නම් කුලියට ගත් දිරාපත් කුඩා ගෙයක ය. ඇතැම් විට අළුතින් තනන ගොඩනැගිලි ද පුස්තකාලයකට සුදුසු නොවන ස්ථානයක සකසුරුවම්කම ඇතිව ඉතා පටු ලෙස ගොඩ නගන බව ද පෙනේ.

පළාත් පාලන අමාත්‍යාංශ යේ නිර්මාණ අංශ ය මගින් සැලසුම් කරන නව පුස්තකාල ගොඩනැගිලි ඉතා හොඳ තත්ත්වයක පවතී. බල මණ්ඩල මගින් එම සැලැස්මකට අනුව පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම ප්‍රශංසනීය ය. බොහෝ විට නගර සභා කාර්යාල හා යා කර තනන ගොඩනැගිලි ටික කලක දි වෙනස් කිරීමට සිදු වෙයි. පොත් පත් වැඩිවීම, සාමාජික සංඛ්‍යාව හා පාඨක පිරිස දිනෙන් දින අභිවර්ධනය වීම, ඔවුන්ට පහසුකම් සැලසීමට ඇති අවශ්‍යතාවය, නගර ශාලාවේ කලබලකාරී සද්ද බීම වැනි විවිධ ප්‍රශ්න එවැනි පුස්තකාලයකට බලපෑමට පටන් ගනියි. ඒ ඒ නගර සභා සහ ගම්සභා මගින් වියදම් කළ හැකි මුදල් ප්‍රමාණයට සරිලන සේ පුස්තකාල ගොඩනැගිලි

නිර්මාණය කර ගැනීමේ වරදක් නැත. එහෙත් තනත කෙබඳු ගොඩනැගිල්ලක වුව ද පුස්තකාල විද්‍යානුකූල බවක් තිබිය යුතු ය. යටත් පිරිසෙන්, සඟරා අංශයට හා විමර්ශණ අංශයට ගැලපෙන ආලෝකය හා වාතාශ්‍රය හොඳින් ලැබෙන කාමර දෙකක්, පත්‍ර සඟරා සඳහා විමර්ශන අංශයේ ම වෙන් කළ කොටසක්, ළමයින් සඳහා අංශයක් හා පුස්තකාල කාර්යාලයක් අවශ්‍යයෙන්ම තිබිය යුතු ය. එහෙත් පුස්තකාලය වැඩෙන, සජීවී භාවයක් ඇති තැනක් ලෙස සලකා කටයුතු කිරීම පාලක පක්ෂයේ අරමුණ විය යුතු ය.

පුස්තකාල ගොඩනැගිල්ල මෙන්ම දැව භාණ්ඩ හා උපකරණවල ඇති අවශ්‍යතාව වැදගත් ය. ගොඩනැගිල්ලේ ප්‍රමාණයට සරිලන දැව භාණ්ඩ හා පුස්තකාලයීය උපකරණ අත්‍යාවශ්‍ය වෙයි. පොත් රාක්ක, අල්මාරි, මේස, පුටු, දැන්වීම් පුවරු, පින්තූර පුවරු, සඟරා රාක්ක, පත්තර රාක්ක, ත්‍රිපාද පුටු, දින මුද්‍රා හා පුස්තකාල ප්‍රවේශ පත්‍ර අසුරන භාණ්ඩ අත්‍යාවශ්‍යයෙන් ම තිබිය යුතු වෙයි. ළමා අංශයක තිබෙන පුටු මේස හා පින්තූර පුවරුවල විශේෂයක් තිබෙයි. ප්‍රමාණයෙන්, හැඩයෙන් හා වර්ණ යෙදීම් ඒ කෙරෙහි බලපවත්වයි. පුස්තකාලයක් තුළ මේ සෑම භාණ්ඩයක් ම මනාව සංවිධානය කළ යුතු වෙයි.

පුස්තකාලයක ඉතා ම වැදගත් කොටස හිමි වන්නේ පොත් පත් වලට ය. කෙතරම් බඩු බාහිරාදිය ක්‍රමානුකූලව සංවිධාන කර තිබුණ ද පුස්තකාලයක තිබෙන පොත් පත් ප්‍රමාණය හා පොත් පත් වල ශාස්ත්‍රීය වටිනාකම ප්‍රජා සමූහය කෙරෙහි බෙහෙවින් බලපානු ලැබෙ යි. අනිකුත් පහසුකම් වලට වඩා ග්‍රාමීය පුස්තකාලයක පොත් පත් සඳහා විශේෂ තැනක් හිමි වෙයි. ගමේ පුස්තකාලයට පැමිණෙන්නේ නගරය ආශ්‍රිතව වෙසෙන්නන් පමණක් නොවෙයි. ඈත දුර බැහැර සිට පුස්තකාලයට පැමිණෙන අය බොහෝ වෙති. ඔවුන් අතර තරුණ, තරුණියන්, කාන්තාවන් හා පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් බොහෝ දෙනෙකි. සමහර විට මොවුන්ගෙන් වැඩි දෙනෙකුට පුස්තකාලයට පැමිණ වැඩි කාලයක් ගත කිරීමට අවස්ථාවක් නො ලැබෙයි. නගරයට පැමිණ සපුරා ගත යුතු වෙනත් අවශ්‍යතාවන්, ගමනාගමන දුෂ්කරතා නිසා ඊ බෝ වීමට පෙර නිවෙස් බලා පිටත්වීම යන ප්‍රශ්නවලට මුහුණ පෑමට ඔවුන්ට සිදු වෙයි. දුර බැහැරින් එන පාසැල් ශිෂ්‍යාවන් දිවා කාලයේ දී හෝ පාසැල ඇරී නිවෙස් බලා යන විට පුස්තකාලයට පැමිණ පොත් රැගෙන යති. පාඨකයින් ට නිකුත් කරන පොත්පත් වල බාහුල්‍යතාව හා ශාස්ත්‍රීය වටිනාකම මේ අනුව බෙහෙවින් බලපානු ලැබේ. සෑම සාමාජිකයකුට ම තමාගේ රුචිකත්වය පරිදි ගෙන යාමට වැදගත් පොතක් නිතරම පුස්තකාලයේ තිබිය යුතු ය.

ග්‍රාමීය පුස්තකාලයකට නිතර එන පිරිස අතරින් වැඩි දෙනෙකු ළමයින් හා යෞවනයින් වෙති. එසේ නො එන්නන් අතරින් වඩාත් පෙළඹ විය යුත්තෝ ද ඔවුහු ම වෙති. කෙසේ වුව ද පුස්තකාලයට හුරු පුරුදු වූ අයෙකු ඉන් මිදී යන්නේ ඉතා කලාතුරකිනි. අළුත් අධ්‍යයන ක්ෂේත්‍රවලට පිවිසෙන සිසුහු ඒ සඳහා ලියැවුනු අළුත් පොත්පත් නිතර අපේක්ෂා කරති. උදාහරණයක් වශයෙන් වාණිජ විද්‍යාව, ආර්ථික විද්‍යාව, කෘෂිකර්මය හා ගෘහ විද්‍යාව වැනි විෂයයන්ට අයත් පොත් පත් ද තම අධ්‍යයන භාෂා මාධ්‍යයෙන් ලියැවෙන විද්‍යා පොත්පත් කෙරෙහි ද ග්‍රාමීය පුස්තකාලයක වුවද පෙරට වඩා උණුසුමක් දක්නට ලැබෙයි. ග්‍රාමීය මහජන පුස්තකාලයක ඇති විශේෂය නම් සෑම තරාතිරමකම අයෙකුටම කියවීමට පොතක් පතක් තිබිය යුතු බව ය.

ලංකාවේ කිසිම පුස්තකාලයක් එම ප්‍රදේශයේ පිහිටීම අනුව නම් කිසියේත් පොත්පත් වලින් සන්තෘප්ත වී නැති බව පෙනෙ යි. වැඩෙන පාඨක සංඛ්‍යාව අනුව පොත් පත් රැස් කිරීම මහත්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

6/=.....

දුෂ්කරතාවක් වෙයි. ප්‍රධාන වශයෙන් පුස්තකාල පොත් පත් ගැනීම සඳහා වෙන් කරන මුදල් ප්‍රමාණය බල පවත්වයි. අතීතේ ඉංග්‍රීසියෙන් හා ඉන්දියාවෙන් ගෙන්වන දෙමළ භාෂා මාධ්‍යයෙන් යුත් පොත් පත් හැරුණු විට සිංහලෙන් හා මෙරටට ගැළපෙන පරිදි දෙමළ භාෂාවෙන් ලියා මෙහිම පළ කරන විවිධ කෘති තවමත් දුර්ලභ ය. කලෙක සිට මෙරටට ගැළපෙන පරිදි උසස් කෘති තෝරා සිංහලට හා දෙමළට පරිවර්තන හා අනුවාද කිරීමට පටන් ගත්තේ රජයේ අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව යි. ඇතැම් කෘති පරිවර්තන උසස් තත්ත්වයෙන් යුක්ත වුව ද මෙය සිංහල හා දෙමළ ද්විභාෂාවන්ගෙන් ශිල්ප ශාස්ත්‍ර හදාරණ සිසුන්ට කරන ලද උසස් සේවයක් ලෙස සඳහන් කළ හැක. කෙසේ නමුත් කලක් යනතුරුවත් අවශ්‍ය දෙමළ භාෂාවේ පොත් ඉන්දියාවෙන් වුව ද ගෙන්වා ගත හැකි යයි සිතමු. එහෙත් විවිධ විෂයන් ගැන සිංහල මාධ්‍යයෙන් ලියැවෙන කෘති ප්‍රමාණවත් යයි සිතා සන්තෘප්ත විය හැකිද? බොහෝ විට ග්‍රාමීය පුස්තකාලයන් කෙරෙහි වැඩි දෙනකුගේ බස් වහර තදින් බලපානු ලැබෙයි. සිසුන් අධ්‍යයනය කරන්නේ ද ඒ බසින්. ඔවුන්ට අවශ්‍ය පොත් පත් වඩාත් අපේක්ෂා කරන්නේ ද ඒ බසින්. බොහෝ ග්‍රාමීය පුස්තකාලවලට එන සිසුන් නිතර අසන්නේ අසුවල් විෂයයට ලියැවුණු පොත් පත් නැද්ද යන්න යි. අපි එම පොත් පිළිබඳ අංශය ඔවුන්ට පෙන්වමු. "මේ ඔබගේ විෂය සඳහා හොඳ ඉංග්‍රීසි පොතක්." අපි ඔහුට එකින් එක හඳුන්වා දෙමු. එය මදක් පෙරළා තබන ශිෂ්‍යයා සිංහලෙන් ලියැවුණු පොත් නැද්ද? යි අසයි. "පොත් කීපයක් තිබෙනවා. ඒ සියල්ලම සාමාජිකයින් අරන් ගිහින් තියෙයි."

දෙමළ භාෂාවෙන් ඉගෙනුම ලබන සිසුන්ගේ ප්‍රශ්නය ද මීට වඩා වැඩි වෙනසක් නැත. මෙවැනි ප්‍රශ්න පුස්තකාලයාධිපතිවරුන්ට නිතර මුහුණ පෑමට සිදු වන ඒවා වෙයි.

ග්‍රාමීය පුස්තකාලවලට සපයා ගත හැකි පහසු දේ නම් දිනපතා පුවත්පත් ඇතුළු ප්‍රවෘත්ති පත්‍ර ආයතන වෙතින් ප්‍රකාශ කරන සතිපතා හා මාසික පත්‍ර සඟරාත් වේ. ඒ හැර ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍ය සඟරා ද සපයා ගැනීම දුෂ්කර නොවේ. බොහෝ දෙනෙක් දිනපතා පුවත් පත් කියවීමට කැමැත්තෝ ය. සාමාජික, ආර්ථික, දේශපාලනික, පුද්ගල හා ආයතන තොරතුරු කුතුහලය උපද වන පුවත් කලාව හා සංස්කෘතික කටයුතු, විවිධ දැන්වීම් බැලීමට, විමසීමට මිනිස්සු උනන්දුවක් දක්වති. සාමාන්‍ය පුවත්පත් වල උසස් ශාස්ත්‍රීය හැඩයක් නැත්නම් නොලැබුනත් එක් වැදගත් කරුණක් නම් පාඨකයා කියවීමට පෙළඹවීමේ ශක්තියක් එයින් ඇති වීම යි. තවත් අතකින් තමා ජීවත් වන ලෝකයේ ඇති වන විවිධ වෙනස්කම් දෙස අවබෝධයකින් බැලීමට ඔහුගේ මෙම කියවීම හේතු විය හැක. බොහෝ ඌන සංවර්ධිත රටවල සාමාන්‍ය මිනිසුන් කියවීමට පෙළඹවීමට ඇති අපහසුව කලින් වරක ද සටහන් කර ඇත. එහෙත් ජීවිතයේ ප්‍රශ්න දෙස අව්‍යාජයෙන් බලා සරළ භාෂාවෙන් ලියැවෙන පොත් පත් කෙබඳු කෙනෙකු වුවද කියවීමම නැඹුරු කරවයි. මෑත කාලයක සිට තරුණ ලේඛකයන් වෙතින් ලියැවෙන සරළ නව කථා මගින් "අලුතින් කියවීමට පෙළඹීමේ" කර්තව්‍යය මනාව ඉටු කරයි. පුවත් පත්වල කොටස් වශයෙන් පළ වෙන කවිකථා හා වෙනත් ජනප්‍රියාංග කෙරෙහි පාඨකයින් උනන්දු වන බව පෙනෙයි. විශාරද දෘෂ්ටියක් මත පිහිටා මේ ක්‍රියාව බොළඳ යයි පිළිගැනීම නුසුදුසු ය. කුමන මාර්ගයකින් හෝ කියවීමට හා ලිවීමට පෙළඹුනු පසු යථාවයෙන් ම හොඳ දේ තෝරා ගැනීමට ඔවුහු හුරු වෙති. ග්‍රාමීය පුස්තකාල මගින් මේ වඩාත් අධ්‍යනයක් කියවීමට යොමු කරවන කවුළුව විවෘත කිරීමට සිදු වෙයි. බොහෝ අය සරළ දේ කියවීමට දක්වන කැමැත්ත ග්‍රාමීය පුස්තකාලයක දී දැක ගත හැක. එසේ වුවද පුස්තකාල සේවකයන් පොත් තේරීමේ දී කිසිසේත් බොළඳ තත්ත්වයට පත්

නොවීමට පාලකයින් වග බලා ගත යුතුය. මාරක කථා පොත්, මානව හිතවාදී-භාවයෙන් තොරව ලියැවෙන කාම ශෝභී දිවියෙහි පුවත් ඉස්මතු කරන පොත් පත් සඟරා - පුස්තකාලයකට කොහෙත්ම අවශ්‍ය නොවේ.

ග්‍රාමීය පුස්තකාලයක සෙසු අංශය මෙන්ම ඉතා වැදගත්ම අංශය විමර්ශන අංශයයි. බොහෝ දුර්ලභ වර්ගයේ පොත් පත්, පාලන වාර්තා, ගැසට්, හැන්සාඩ්, ඩිරෙක්ටරි, ශබ්ද කෝෂ, විශ්ව කෝෂ, පාරිභාෂිත වදන් මාලා පමණක් නොව ප්‍රදේශයේ ඉතිහාසය හා කෞතුක වටිනාකම් පෙන්වන සිතියම්, කොඩි හා වෙනත් භාණ්ඩ ග්‍රාමීය පුස්තකාලයක අනිවාර්යයෙන් ම තිබිය යුතුය. විමර්ශන අංශයට තෝරා ගන්නා පොත් පත් බැහැර ගෙන යාමට නිකුත් නොකළ යුතුය. පුස්තකාලයට එන සෑම කෙනෙකුගේ ම "ක්ෂණික අවශ්‍යතාවන් සඳහා" එම පොත් පත් තිබිය යුතුය. බොහෝ ග්‍රාමීය පුස්තකාලවල ඇති ඌනතාවයක් නම් විමර්ශන අංශය සඳහා අවශ්‍ය කාමරයක් නොමැති කමයි. බොහෝ විට පත්‍ර සඟරා අංශයට ම ගෙන ගොස් විමර්ශන කෘති පරිශීලනය කිරීමට පාඨකයා ට සිදු වෙයි. එබැවින් එම කාර්යය හරිහැටි සිදු නොවෙයි.

ග්‍රාමීය පුස්තකාලයට අවශ්‍ය තවත් අංගයක් නම් ළමා අංශය යි. විශේෂයෙන් පුස්තකාලයට එන කුඩා ළමයින් සඳහා මේ අංශය විවෘත වේ. ළමයින් ගේ කියවීම හා විමසීම පිළිබඳ නැගෙන ප්‍රශ්න වලට පිළිතුරු දිය හැකි හොඳම ස්ථානය ළමා අංශය යි. සෝවියට් දේශයේ ඇති ළමා පුස්තකාල අංශ, ළමයින් ගේ සිතැඟි මනාව වටහා ගෙන ක්‍රියා කරන බව පෙනේ. ළමයි එක් එක් වර්ගයේ පෞද්ගලික භාවයන් අගයති. සමහරු නිර්භීත ක්‍රියා ගැනත්, තවත් සමහරු චරයකු ගේ ගති ගුණත්, තවත් කෙනෙක් ඉතිහාසය හෝ විද්‍යාවට එකඟ දෙයක් අගයති. මේ සෑම දෙනෙකුගේ ම සිතැඟි අවබෝධයෙන් කටයුතු කිරීමට පුස්තකාලයාධිපතිවරුන් ට සිදු වෙයි.[4]

ළමයින් සඳහා ලියැවුනු සැහෙන පොත් පත් සංඛ්‍යාවක් මෙරට ග්‍රන්ථ ප්‍රකාශන ආයතන මගින් නිකුත් කර ඇත. දෙමළ සහ ඉංග්‍රීසි ළමා පොත් ද මෙරටට ගෙන්වයි. ළමා අංශයක් පිළියෙළ කිරීමේ දී යොදන වර්ණ, චිත්‍ර, පොත් රාක්ක, මේස පුටු හා වෙනත් උපකරණ සියල්ලම ළමයින් ගේ කෞතුක ලෝකයට ගැලපෙන සේ පිළියෙළ කර ගත යුතුය. එමෙන්ම ළමයින් තේරුම් ගෙන ඔවුන් ගේ සිත් ඇදී යන පරිදි කාරුණිකව සැලකීමට පාලකයින් දක්ෂ විය යුතුය. පුස්තකාල යේ නීතිරීති වලට අනුකූලතාවක් දැක්වීමෙන් එහි කෙරෙන ක්‍රමානුකූල වැඩ පිළිවෙළ නිසා ළමයි නිතැතින්ම ආචාරශීලී වූ ද සංවිධානාත්මක වූ ද ගති පැවැතුම් ඇති කර ගනිති. පාසැලේ දී නො ලැබෙන තරමේ ආචාරශීලී භාවයක්, තමා විසින්ම කියවා අවබෝධ කර ගන්නා පොත පතින් ලද දැනුමත්, අන්‍යෝන්‍ය ආදරයත්, නිස්ශබ්දතාවය රජ කරන මේ කුඩා කෞතුක ලෝකයෙන් ඕනෑම දරුවෙකු ට ඇති කර ගත හැක. එහෙත් ඒ සඳහා වැඩිහිටියන් ගේ කැපවීම, උනන්දුව හා ඇල්ම උඩයි සියලු වෙනසක් ම ඇති විය හැකි වන්නේ.

මෙරට ප්‍රධාන නගරවල ඇති මහජන පුස්තකාලවලට අනුබද්ධ ව ළමයින් සඳහා වෙනම පුස්තකාල තැනීමට දැන් කටයුතු කර ගෙන යන බව පෙනේ. එහෙත් ගමක නම් ග්‍රාමීය පුස්තකාලයට ම යා කර මෙවැනි අංශ ගොඩනැගීමට සිදු වී තිබේ. කෙසේ වුවද අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් ප්‍රදේශයක් පාසා විවෘත කිරීමට වෑයම් කරන පාසැල් පුස්තකාල සාර්ථක කර ගැනීමට හැකි වුවහොත් එය මෙරට ගැමි දරුවන් ගේ මහත් භාග්‍යයක් සේ සැලකිය හැක.

---

"මේ පුස්තකාලයන් පිහිටුවනු ලබන්නේ ඒ ඒ ජන්දදායක කොට්ඨාශයෙහි මධ්‍යස්ථානයක් වශයෙන් සැලකෙන විද්‍යාලයක ය. අවට විද්‍යාලයන් කීපයකට ම ඒ පුස්තකාලය ප්‍රයෝජනයට ගත හැකි වන පරිද්දෙන් එහි විධි විධාන සලසනු ලැබේ." [5].

ග්‍රාමීය පුස්තකාලවලට ඉසිලීමට සිදුව ඇති වගකීම්, පහසුකම් හා ආර්ථික බරින් තරමක වෙනසක් ඇති කිරීම, පාසැල් පුස්තකාල ළමයින් සඳහා ම කැප වූ විශේෂ අංශයක් නිසා එම රටාවට අනුකූල ලෙස කටයුතු පිළියෙළ කිරීමට ඇති පහසුව, ග්‍රාමීය පුස්තකාලය සමඟ ඇති කරගත හැකි අන්තර් සම්බන්ධතා උඩ සිසුන්ට අවශ්‍ය පහසුකම් වඩාත් තහවුරු කිරීම ආදී කාර්යයන් කීපයක් මේ මගින් ඇති කළ හැකි වෙයි.

ග්‍රාමීය පුස්තකාලය සමග ප්‍රජා සමූහ සම්බන්ධතා ඇති කළ හැක්කේ පුස්තකාල යේ අභ්‍යන්තර කටයුතුවලින් පමණක් නොවෙයි. ප්‍රජා සංවර්ධන කටයුතු සඳහා පුස්තකාලයකට බාහිර වශයෙන් ද ඉදිරිපත් විය හැක. ඒ සඳහා අධ්‍යාපනික හා සංස්කෘතික වැඩ සටහනක් පිහිටුවා ගෙන මසකට වරක් ප්‍රදේශයේ විශේෂ කාර්යයක නියැලී සිටින උගතෙකුට ඇරයුම් කර දේශනයක් පැවැත්විය හැක. බොහෝ විට මෙම දේශන සෑම කෙනෙකුට ම වාගේ සහභාගිවීමට හැකි තත්ත්වයේ සරල එමෙන් ම වැදගත් අරමුණක් අපේක්ෂා කරන්නක් විය යුතුය. විදේශීය සංචාරක අත්දැකීම්, ප්‍රදේශ යේ කෞතුක වැදගත්කම, වර්තමාන සාහිත්‍යය, ආර්ථික හා සාමාජිකත්වය, ප්‍රජාව සඳහා අලුත් අරමුණු, කෘෂිකර්මය හා කාර්මික සංවර්ධනය, සංයුක්ත මණ්ඩල, මහජන බැංකුව, ප්‍රදේශයේ අපරාධවල ස්වරූපය ආදී කෙබඳු මාතෘකාවක් උඩ වුවද කාටත් සහභාගිවීමට හැකි අත්දමින් දේශන සකස් කර ගත හැක. බොහෝ විට උසස් මාතෘකා තෝරා ගෙන ඒ පිළිබඳ ගැඹුරු විස්තර ඉදිරිපත් කළ හැක්කේ ගමේ පාසැලේ උසස් පන්තිවල ඉගෙන ගන්නා සිසුන්ටත්, ගුරුවරුන්ටත්, තවත් උගතුන් කීප දෙනෙකුටත් පමණකි. එහෙත් එම මාතෘකාවට අදාළ කරුණු සරල ලෙස සාකච්ඡා කිරීමෙන් කාටත් ප්‍රයෝජන ඇති වෙයි. බොහෝ අවස්ථාවලදී මෙවැනි දේශන හා සමූහ සාකච්ඡා වැඩ සටහන් පැවැත්වීමට පුස්තකාලය ප්‍රමාණවත් නොවෙයි. ඒ සඳහා කාටත් පහසුවෙන් පැමිණිය හැකි පාසැල් ගොඩනැගිල්ලක් තෝරා ගැනීම යෝග්‍යය. හැකි අවස්ථාවල දී කෘෂිකර්මය, සමුපකාර ව්‍යාපාරය, කාර්මික සංවර්ධනය, ලෝකයේ විවිධ රටවල විවිධ ජීවන රටාවන්ට නතුව අලුත් අරමුණු සොයන මිනිසුන් ගැන කියන චිත්‍රපට සංදර්ශන පැවැත්වීමෙන් ග්‍රාමීය පුස්තකාලයට තවත් අංශයකින් සේවයක් කිරීමට පුළුවන. කෙතරම් ඌනතාවන්ගෙන් යුක්ත වුවද මෙවැනි වැඩ සටහන් මගින් ප්‍රජා අවබෝධයන් පුළුල් කිරීමට සාර්ථක ලෙස බලපා ඇති බව එවැනි වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමෙන් අපට පෙනී ගොස් ඇත.

ප්‍රදේශයක ප්‍රජා සමූහ රටාව තුළ අලුත් සමාජ සංවර්ධන පෙරළියක් ඇති කිරීමට ග්‍රාමීය මහජන පුස්තකාලයට හාස්කමකින් මෙන් කළ නො හැක. සමාජ සංවර්ධන හා සංරක්ෂිත සෑම සංවිධාන යක් හා ඒක රාශී වූ සම්බන්ධතාවක් ඇති කර ගැනීමට ඇයට සිදු වෙයි. ඒ හැර ඉතා වැදගත් කරුණු නම් ඒ ඒ පළාත් පාලන බල මණ්ඩලවල ප්‍රධානීන්ගේත් පුස්තකාල කාරක සභාවල උනන්දුවත් පුස්තකාල කාර්ය මණ්ඩලයේ ඇති නිපුණතාවයත් ය. බල මණ්ඩලවල සභාපති, පුස්තකාල කාරක සභාවේ සභාපති ලෙස ද පුස්තකාලයාධිපති එහි ලේකම් ලෙස ද නාගරික මන්ත්‍රීවරු කීප දෙනකු හා ප්‍රදේශයේ රාජ්‍ය සේවාවන්හි යෙදී සිටින උගතුන් කීප දෙනෙක් ද බොහෝ ග්‍රාමීය පුස්තකාල කාරක සභාවල නිලධාරීන් ලෙස සේවය කරති. පුස්තකාල පාලනය හා සංවර්ධනය පිළිබඳව කාරක සභාව මගින් ගන්නා තීරණ එක හෙළාම ඇයට ක්‍රියාත්මක කළ නොහැක. එම තීරණ බල මණ්ඩල යේ මහා සභා රැස්වීම් වාරවල දී සාකච්ඡා වී අනුමත විය යුතුයි. ඇතැම් තීරණ අනුමත වෙයි. ඇතැම් විට කල් තැබීමට සිදු වෙයි. මේ අනුව හදිසියෙන් පුස්තකාලයට අත්‍යාවශ්‍ය වූ භාණ්ඩ, උපකරණ, පොත් පත් ගැනීම ආදිය ප්‍රමාදවීමට ඉඩ ඇත.

---

ග්‍රාමීය මහජන පුස්තකාල සඳහා වර්ෂයක් පාසා රජයේ ආධාර මුදලක් වෙන් කෙරේ. පොත්පත් ගැනීම සඳහා එම මුදල කැප වේ. ඒ ඒ බලමණ්ඩල මගින් පුස්තකාලයට දක්වන උනන්දුව අනුව මුදලක් වෙන් කෙරේ. එය දළ වශයෙන් පොත් පත් සඟරා, ගොඩනැගිලි උපකරණ, ඇට භාණ්ඩ හා නඩත්තුව සඳහා ද වෙයි. පුස්තකාලය වර්ෂයක් තුළ නඩත්තු වන්නේ මේ සීමිත මුදල් වලිනි. කිසිම පුස්තකාලයකට තමන් අපේක්ෂා කරන තරමේ ආධාර මුදලක් වෙන් කර ගැනීම උගහට වෙයි. වැඩෙන පාඨක සංඛ්‍යාව අනුව නැගෙන දැනුම් පිපාසය සන්තෘප්ත කිරීම පුස්තකාලයාධිකාරින් හමුවේ නිරන්තරව ඇවිලෙමින් පවත්නා පැනයක් වෙයි. දියුණු වන පුස්තකාලයක මේ ප්‍රශ්නය පැන නැඟීම අනිවාර්ය ය.

ග්‍රාමීය පුස්තකාලයක මනා සංවිධානයක් හා ක්‍රමානුකූල පාලනයක් ඇති කිරීමට හේතු වන තවත් ප්‍රධාන බලවේගයක් ඇත. ඒ පුස්තකාල කාර්ය භාර නිලධාරි මණ්ඩලය යි. මෙම නිලධාරි මණ්ඩලයට පුස්තකාලයාධිපති, පුස්තකාල සහායවරු, කාර්ය සහායකවරු ද අයත් වෙති. එහෙත් බොහෝ ග්‍රාමීය පුස්තකාලවල සිටින්නේ එක් නිලධාරියෙකු නැති නම් දෙන්නෙකු පමණකි. මීට වඩා බැරෑරුම් කරුණ නම් මෙවැනි බොහෝ නිලධාරීන් තුළ පුස්තකාල සේවාව පිළිබඳව ඇති නොදැනීම යි. මේ "නොදැනුම" නිසා සිදු වන වැරදි බොහෝ ය. ඔවුහු තම තමන් ගේ සිතැඟි ලෙස තම සේවය තේරුම් ගන්න උත්සාහ කරති. බොහෝ දෙනෙක්, ලිපිකරුවෙකු හෝ වෙළඳ සේවකයකු ලෙස තම කාර්ය නිම කිරීමට සිතති. සැබැවින්ම තමාගේ කාර්ය, අධ්‍යාපනික හා සංස්කෘතික සේවයක් ලෙස නො සලකති. එයින් සිදු වන වැරදි උඩ ජනතාව ට පුස්තකාල එපා කරවති.

සෑම පුස්තකාලයාධිකාරියකු ම ප්‍රාදේශීය ප්‍රජා සමූහය ගැන අවබෝධයක් ඇති කර ගත යුතුම ය. ප්‍රාදේශීය සමාජ රටාවක් තුළ ආර්ථික ක්‍රමය, චාරිත්‍ර වාරිත්‍ර ඇතුළු සංස්කෘති උරුමකම් ආදියෙහි වෙනස්කම් දක්නට ලැබෙයි. බොහෝ අවස්ථාවල දී පුස්තකාල නිලධාරීන්ට ඉතා කාරුණිකව හා ඉවසීමකින් ප්‍රජා ප්‍රශ්නවලට මුහුණ දීමට සිදු වෙයි. විශේෂයෙන් ළමයින් හා සමාජ සම්මතයන් ගැන වැඩි තැකීමක් නැති වැඩිහිටියන් පිළිබඳව විවිධ ප්‍රශ්න පැන නඟී. ඉතා වේගයෙන් කථා කිරීමට පුරුදු වූ පුද්ගලයකු ට පුස්තකාලය තුළ එසේ කිරීම නුසුදුසු බව කාරුණිකව වටහා දීමෙන් ඔහු එය නැවත නො කරයි. යම්කිසි ප්‍රශ්නයකට පිළිතුරක් සොයන අයකුට එය කාරුණිකව වටහා දීමෙන් ඔහු පුස්තකාලය කෙබඳු තැනක්දැ යි තේරුම් ගනියි. ළමයින්ගේ ප්‍රශ්න වටා ඇති හැඟීම් තේරුම් ගත යුතුය. සමහර විට තමාට ඇති අවශ්‍යතාවය පැහැදිලිව කියා ගැනීමට ඔහුට නො හැකි වෙයි. පුස්තකාලයාධිපති ඔහුට අවශ්‍ය දෑ වහා වටහා ගැනීමේ ශක්තියක් ඇත්තෙකු විය යුතුය.

මේ සෑම කරුණක් යටින් දිවෙන්නේ පුස්තකාලයාධිකාරි වරුන්ගේ දක්ෂතාවය හා නිපුණතාවය පිළිබඳ අදහස යි. ඔවුහු පාඨකයින් නගන ඕනෑම ප්‍රශ්නයකට තෘප්තිමත් සාර්ථක පිළිතුරක් දීමට දක්ෂ විය යුත්තා හ. කාර්යක්ෂම විය යුත්තා හ. ඔහු ගේ දැනුම එක් අංශයක ට පමණක් යොමු නො වෙයි. සමහර විට කෙනකුට පාර්ලිමේන්තු විවාද සම්බන්ධව පිළිතුරක් දුන් වහාම තව කෙනකුට භෞතික විද්‍යාව පිළිබඳ පොතක් ගැන පිළිතුරක් දීමට සිදු වෙනවා ඇත.

ග්‍රාමීය පුස්තකාල සඳහා පුහුණු පුස්තකාලයාධිපතිවරු පත් කිරීම සෑම රටකම පාහේ නැගෙන තවත් බලවත් ප්‍රශ්නයක් වෙයි. එංගලන්තයේ ද මේ ප්‍රශ්නය තදින් බලපවත්නා බව එහි ලෆ්බරෝ කාර්මික විද්‍යාලයී ය පුස්තකාල විද්‍යාංශ යේ සේවය කළ පුස්තකාල සේවාව පිළිබඳව යුනෙස්කෝ විශේෂඥවරියක් ලෙස මෙරටට පැමිණි ඒ.ජේ.එවන්ස් මැතිණිය පවසයි.[6] ඇමරිකානු පුස්තකාල සංගමයත් වෙනත් දියුණු සමාජවාදී රටවල පුස්තකාල සේවා සංවිධානත්, ග්‍රාමීය හා ළමා පුස්තකාල සඳහා නිලධාරීන් පුහුණු කිරීමට ක්‍රමවත් වැඩ සටහන් භාවිතා කෙරේ.

---

ලංකා පුස්තකාල සංගමය මගින් පුස්තකාල නිලධාරීන් පුහුණු කිරීම සිදු කෙරෙමින් පවතී. පුස්තකාල විද්‍යාව පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාවක් පශ්චාත් උපාධි මට්ටමින් පේරාදෙණි යේ ලංකා විශ්ව විද්‍යාලය මගින් කලකට ඉහත පවත්වන ලදී. කණිෂ්ඨ විශ්ව විද්‍යාල ඩිප්ලෝමා පාඨමාලාවක් ද කලක් පැවතිණ. දැනට ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල යේ විද්‍යාලංකාර මණ්ඩප යේ පුස්තකාල විද්‍යා උපාධි පාඨ මාලාවක් පවතින අතර, තව නොබෝ දිනකින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් තැපැල් මාර්ගික පුස්තකාල විද්‍යා පාඨමාලාවක් ඇරඹීමට යන පුවත ද මෙහි ලා සඳහන් කිරීම වටනේ ය. ඒ හැර සේවාස්ථ පුහුණු පාඨ මාලා ද වරින් වර පුස්තකාල සේවා මණ්ඩලය මගින් පාසැල්, මහජන හා ගුරු පුස්තකාල සේවීන් විෂයෙහි පැවැත් වේ. එමෙන්ම පළාත් පාලන බල මණ්ඩල පුස්තකාල සඳහා පුස්තකාල විද්‍යාව හා සේවාව පිළිබඳ නිපුණ උගතුන් ම පත් කිරීමට පළාත් පාලන සේවා කොමිසන් සභාව දක්වන උනන්දුව ප්‍රසංශනීය යි. ප.පා.සේ.කො. සභාව තවදුරටත් පළාත් පාලන බල මණ්ඩල මගින් පාලනය වන ග්‍රාමීය පුස්තකාල කෙරෙහි මීට වඩා බලපෑමක් ඇති කළ යුතුයි. බොහෝ ග්‍රාමීය පුස්තකාල කෙරෙහි ඒ ඒ පාලන බල මණ්ඩල දක්වන උදාසීනතාවයන් ඉවත් කිරීමට කොමිසන් සභාවට හා දෙපාර්තමේන්තුවට හැකි වෙයි. රජය මුදල් වියදම් කරයි. කොමිසන් සභාව නිපුණ පුස්තකාලයාධිපති වරුන් පත් කරයි. එයින් අපේක්ෂිත ප්‍රයෝජනය ජනතාවට ලැබිය යුතුය.

පුස්තකාල සේවකයින් ශ්‍රේණිගත කිරීමේ හා ඔවුන් ගේ වැටුප් විෂමතාවක් ගැන ද සැලකිල්ලක් දැක්වීම අත්‍යාවශ්‍ය වෙයි. මෙරටට ගැලපෙන පරිදි පුස්තකාල සංවිධානය කිරීම පිළිබඳව නිතර උනන්දුම් හැඟීමක් ඇති උගතෙක් ඒ පිළිබඳව මෙසේ අවධාරණයෙන් සඳහන් කරයි.

"පුස්තකාල සංවිධානය කිරීමට බාධාවක්ව ඇ ත්තේ පුස්තකාල සේවය වෘත්තිය සේවයක් වශයෙන් නො පිළිගැනීම යි. පුස්තකාල පාලනය සඳහා ලිපිකරුවකු ගබඩා කරුවකු හෝ නුපුහුණු ජ්‍යෙෂ්ඨ සමතකු පත් කිරීමෙන් පාලක පක්ෂය අදත් සෑහීමකට පත් වෙති. මේ නිසා රටට අවශ්‍ය තරම් පුස්තකාල නිලධාරීන් පිරිසක් පුහුණු කිරීමේ අවශ්‍යතාවය ගැන සැලකිල්ලක් යොමු වී නැත.[7]"

"පුස්තකාල විද්‍යා අධ්‍යාපන පහසුකම් ඇති කරලීමට මෙන්ම ඒ වෘත්තිය සේවයක් සඳහා ගෙවනු ලබන වේතන ක්‍රමයන් ද සකස් විය යුතුය. දැනට පුස්තකාල යේ සෑහෙන වේතන ක්‍රමයක් ඇත්තේ විශ්ව විද්‍යාලයීය පුස්තකාල නිලධාරීන් සඳහා පමණ ය. ගබඩාකරුවන් හා ලිපිකරුවන් ට ලැබෙන වේතනය මත පුස්තකාල නිලධාරීන් ගෙන් සේවයක් ලබා ගැනීමට තැත් කිරීම ප්‍රඥාගෝචර නොවේ."[8]

පුස්තකාලය "සම්පූර්ණ නිහඬතාවයක් තුළ" ගෙන යන අර්ථාන්විත විප්ලවයකි. චින්තන අරගලයකි. මිනිසුන් එදිනෙදා ජීවිතයේ ප්‍රශ්න හමුවේ අළුත් චෙතසකින් මුහුණ දීමට අවශ්‍ය අවබෝධය ලබා දීමට එම පෙරළිය ට හැකි වෙයි. විශේෂයෙන් ඌන සංවර්ධිත රටක ගැමි ප්‍රජාව හමුවේ ග්‍රාමීය පුස්තකාලයකින් සිදු කළ හැකි සේවය අසීමිත ය. එවැනි සංවිධානාත්මක ග්‍රාමීය පුස්තකාලයකින් ගැමි ප්‍රජා සමූහය හමුවේ ඇති ප්‍රශ්නවලට පිළිතුරු සෙවීම පමණක් නොව මානුෂික සුහදතාවය හා සංස්කෘතික හර පද්ධතීන් මත පිහිටා නව ප්‍රබෝධයක්, කුතුහලයක් හා සමජන සංවර්ධනය ට හිතකර යමක් නිපදවීමට නිතර හැකි වනු ඇත.

## 1977 ආධාර ලබන පුස්තකාල දිස්ත්‍රික්ක පහකින් තෝරයි.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ 1977 සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ බදුල්ල, නුවරඑළිය, හලාවත-පුත්තලම්, හම්බන්තොට හා කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ උතුර යන දිස්ත්‍රික්ක පහෙන් පාසැල් පුස්තකාල විසි අටක් (28) සහ මහජන පුස්තකාල විසි හතක් (27) ද දැනට තෝරා ගෙන තිබේ.

මෙම දෙවර්ගයේ ම පුස්තකාලයන්හි තත්ත්ව සමීක්ෂණයකින් පසුව, රුපියල් දහස (1000) බැගින් වටිනා පොත් හා උපකරණ කට්ටලයක් ප්‍රදානය මූලිකව සිදු වේ. මෙයට අමතරව පුස්තකාලයන්හි ප්‍රගතියට ඉවහල් වන මාර්ගෝපදේශකත්වය, විවිධ යෝජනා, පුස්තකාල සේවාවේ නිරත නුපුහුණු පුස්තකාල සේවිත්ට සේවාස්ථ පුහුණුව, ආදී විවිධ කාර්යයන් ද මණ්ඩලය මගින් සිදු කෙරේ.

මෙම වර්ෂයේ තවත් විශේෂයක් වන්නේ, මහජන පුස්තකාල සඳහා ප්‍රදානය කරනු ලබන පොත් කට්ටලවලට හුදෙක් පොතපතම පමණක් ඇතුළත් නොකර, පුස්තකාල සේවාව සඳහා අත්‍යවශ්‍ය වන ජෝශ් සාක්කු සහිත දින මුද්‍රා ලේබල, සහිත දින මුද්‍රා ලේබල, ග්‍රන්ථ නාම පත්‍රිකා, පාඨක බලපත්‍ර, පුස්තිකා පෙට්ටි, පරිග්‍රහණ ලේඛණ, පොත් ආධාරක හා සූචි කැබිනෙට්ටු ආදර්ශ ප්‍රමිතීන් සහිතව එහි කොටසක් ව ඇතුළත් කර තිබීම යි.

මෙයට හේතු දැක් වූ පුස්තකාල සේවා මණ්ඩලයේ අධ්‍යක්‍ෂක එන්. අමරසිංහ මහතා, ශ්‍රී ලංකාවේ පුස්තකාලවල පවත්නා නොයෙකුත් දුෂ්කරතා අනුව මෙවැනි දේවල් ද ඇතුළත් කිරීම පිළිබඳව සැලකිල්ලට ගත් බවත්, සුදුසු ප්‍රමිතීන් සකස් කර ගැනීමට ද මෙම උපකරණ ඉවහල් විය හැකි බවත් සඳහන් කරයි.

සංවර්ධන වැඩ පිළිවෙළට ඇතුළත් පුස්තකාලවල සංශෝධිත සහිත අවසාන නාමාවලිය ලබන පුස්තකාල ප්‍රවෘත්ති කලාපයේ පළ වේ.

---

## "ඉෆ්ලා" මහජන පුස්තකාල ප්‍රමිති - සිංහලෙන්

ඉෆ්ලා නොහොත්, "අන්තර් ජාතික පුස්තකාල සංගම් සංවිධානය" මගින් පළ කර ඇති මහජන පුස්තකාල සඳහා වන ප්‍රමිතිවල සිංහල සංස්කරණය ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් පරිවර්තනය කොට සකස් කරන ලදුව, දැනට මුද්‍රණයේ පවතී.

මෙම ග්‍රන්ථය මගින් වඩාත් කාර්යක්‍ෂම වූ මහජන පුස්තකාල සේවාවන් පවත්වා ගෙන යාම සඳහා මග පෙන්වීමට මෙම ප්‍රමිතීන් පිළිගත යුතු බව නිර්දේශ කර ඇති අතර, එමගින් ජාතික සේවා මට්ටම් සකසා ගැනීම සඳහා පදනමක් ද සපයනු ඇත.

මහජන පුස්තකාල සඳහා ප්‍රමිතීන් පිළිබඳ මෙම කෘතිය පරිවර්තනය කොට සංස්කරණය කරන ලද්දේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අධ්‍යක්‍ෂක එන්. අමරසිංහ මහතා විසිනි. මෙය පුස්තකාල සේවා මණ්ඩලය මගින් ප්‍රකාශයට පත් කිරීමට නියමිත ප්‍රකාශන පෙළක පළමුවැන්න යි. දැනට සිංහල බසින් අඩුවක්ව පවතින පුස්තකාල ක්‍ෂේත්‍රයට අදාල පොතපත සඳහා වැඩි වන ඉල්ලුම සපුරාලීමට ද මෙම පියවර ඉවහල් වනු ඇතැයි විශ්වාස කෙරේ.

---

## නුපුහුණු පුස්තකාල සේවීන් 194 කට හැඳින්වීමේ පාඨමාලා.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් නුපුහුණු පුස්තකාල සේවීන් 194 කට පසු ගිය වසරේදී හැඳින්වීමේ පාඨමාලා පැවැත්වීමම සමත්ව ඇත්තේ ය. මෙයින් මහජන පුස්තකාල සේවීන් 83 ක සංඛ්‍යාවක් වූ අතර, ගුරු පුස්තකාල සේවීන් 111 ක්ද වූහ.

ගුරු පුස්තකාල සේවීන් සඳහා පාඨමාලා දෙකක් පවත් වන්නට යෙදුණි. ඉන් එකක් පලාලි ගුරු විද්‍යාලයේ දී දෙමළ මාධ්‍යයෙන් ද, අනෙක සිංහල මාධ්‍යයෙන් වේයන්ගොඩ - පත්තලගෙදර (විද්‍යා) ගුරු විද්‍යාලයේ දී ද පවත් වන ලදී.

මහජන පුස්තකාල සේවීන් සඳහා පාඨමාලා හතරක් පසු ගිය වසරේ දී පවත්වන ලද අතර, ඉන් දෙකක් හලාවත හා හොරණ පළාත් පාලන ආයතන වලදී ද, පළාත් පාලන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ සහාය ඇතිව කොළඹ දී සිංහල මාධ්‍යයෙන් එක් පාඨමාලාවක් ද, දෙමළ මාධ්‍යයෙන් තවත් පාඨමාලාවක් ද වශයෙන් පවත් වන ලදී.

පළාත් පාලන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය හා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිර්දේශ කරනු ලබන පුස්තකාල සේවීන් සඳහා පවත් වනු ලබන මෙම පාඨමාලා 1977 වර්ෂයේ දී ද, පුස්තකාල සේවා මණ්ඩලය මගින් පැවැත් වීමට කටයුතු යොදා තිබේ.

මූලික අධ්‍යාපනික සුදුසුකම් පමණක් ඇති, එහෙත් කිසිදු පුස්තකාල පාඨමාලාවක් හදාරා හෝ පුහුණුවක් නො ලබා හෝ ඇති පුස්තකාල සේවීන් විෂයයෙහි මෙම පාඨමාලාව විපුල පලදායී මූලික අවබෝධයක් ලබා දීමට ඉවහල් වන බව පෙනී ගොස් තිබේ.

1972 දී පුස්තකාල සේවා මණ්ඩලය මගින් ආරම්භ කරන්නට යෙදුණු වූ මෙම හැඳින්වීමේ පාඨමාලා වැඩ පිළිවෙළ ඔස්සේ මෙතෙක් මූලික හැඳින්වීමේ පාඨමාලාව හදාරා සාමාන්‍ය අවබෝධයක් ලැබූ පිරිසට මෙම වසරේ දී ඊට උසස් මට්ටමකින් එම පාඨමාලාව පැවැත් වීමට කටයුතු යොදා ගෙන යනු ලැබේ.

## බන්ධනාගාර ගත වූවන්ට පුස්තකාල මණ්ඩලය මගින් පොත් කියවීමේ පහසුකම්.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය මගින් පුස්තකාල සේවා ව්‍යාප්ත කිරීමේ වැඩ පිළිවෙළ යටතේ මහනුවර බෝගම්බර බන්ධනාගාරයේ සිරකරුවන ට පොත් කියවීමේ පහසුකම් සැලසීමට සමත් ව ඇත.

බන්ධනාගාර අධිකාරී එච්.පී.ධර්මදාස මහතා ප්‍රමුඛ බන්ධනාගාර කාර්‍ය මණ්ඩලය සමග එළඹි සම්මුතියක් පරිදි මෙම පුස්තකාල සේවාව අරඹා ඇත. මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය මගින් මේ යටතේ සෑම මාසයකම පොත් සියයක් සිරකරුවන ගේ ප්‍රයෝජනය පිණිස සපයනු ලැබේ.

බන්ධනාගාර නිලධාරීන් හා සිරකරුවන ගේ නියෝජිතයින් පිරිසක් සෑම මසක ම ප්‍රාදේශීය මධ්‍යස්ථානය වෙත ගොස් කියවීම් සැපයූ පොත් ආපසු භාර දී අලුත් පොත් තෝරා ගැනීමට ද මෙහිදී අවකාශ සලසා ඇත.

මෙම වැඩ පිළිවෙළ බෙහෙවින් සාර්ථක බවත්, සිරකරුවන ගේ කියවීම් රුචිය උද්‍යෝගිමත් කිරීමට සමත්ව ඇති බවත්, බන්ධනාගාර නිලධාරියකු මේ ගැන සඳහන් කරමින් පවසා සිටි.

---

ජනතාව හා පොතපත ඒකරාශී කිරීම:

"බුන්කෝ" හෙවත්
ජපන් රටේ ළමා පුස්තකාල.

ටෝකියෝ ළමා පුස්තකාලයේ අධ්‍යක්ෂක
කියෝතෝ මත්සුවෝකා විසිනි.

"බුන්කෝ" යන ජපන් වචනයෙහි අරුත වූ කලී "සාහිත්‍ය කෘතිවලින් පිරි ගබඩාව" යන්නයි. යම් කිසිවෙක් සතු පුද්ගලික පොත්පත් එකතුවක් සඳහා එය නිතරම භාවිතා වේ. එම වදනම අද දිනයෙහි ළමයින් අතරද භාවිතා වන්නේ ඊට වෙනස් අරුතකිනි. එය අද "ළමා පුස්තකාලය" යන අදහසද හඟවන්නකි. රජයේ නොවන විවිධ කණ්ඩායම් හා පුද්ගලයන් විසින් මේවා සංවිධානය කර තිබේ. අවාසනාවකට මෙන්, ජපන් රටේ මහජන පුස්තකාල හොඳින් සංවිධානය හා සංවර්ධනය වී නොමැත්තේය. ළමයින්ගේ කියවීම් ක්ෂේත්‍රය විෂයෙහි මෙම කුඩා පුද්ගලික පුස්තකාල ක්‍රමය වැදගත් වූ කාර්ය භාරයක් ඉටු කිරීමට සමත්ව ඇත්තේය. එය මුළු රට තුළ ම ළමයින් හා පොතපත විෂයෙහි මුළුමනින් ම පෘගේ සැලකිය යුතු උද්‍යොගිමත් භාවයක් ඇති කිරීමෙහි සමත්වෙමින් සිටී.

"බුන්කෝ" පුද්ගලයින්ගේ ගෙවල සංස්ථාපනය වී ඇත. බොහෝ විට ගෘහිණියෝ පොතපතින් ලබන ආශ්වාදය සෙසු අසල්වාසීන්ගේ ළමුන් හා බෙදා හදා ගනු රිසියෙන් එම ළමුනට තම නිවසට පැමිණෙන සේ ආරාධනා කරති. සාමාන්‍යයෙන් සතියකට වරක් සන්ධ්‍යා භාගයේ මෙම ඇරයුම කෙරෙයි. ඇය තමා සතු ළමා පොත්පත් එකතුව ඔවුනගේ පරිහරණය සඳහා නිකුත් කරන්නීය. ඇතැම් විට ළමුනට ඒවා ගෙදර ගෙන ගොස් කියවීමට හෝ නැත්නම් ළමුන් වෙනුවෙන් ඒවා ඇයට කියවීමට සිදුවෙයි. මෙය වූ කලී එකකු සතු පොතපත ඔහුගේ පුද්ගලික හිතවතුනට බැහැර ගෙන ගොස් කියවීමට ලබා දීම පිළිබඳ ප්‍රථම පියවරයි; වෙනත් විදිහකට කීවොත්, එය තමාට සැලසුන කියවීමේ ආස්වාදය සෙස්සන් හා බෙදාහදා ගැනීමයි.

පුද්ගලිකව පවත්වාගෙන යනු ලබන මෙවන් කටයුත්තක් "කාටෙයි බුන්කෝ" යනුවෙන් ජපන් බසින් ව්‍යවහාර වෙයි. එය "ගෙදරක පුස්තකාලය" යන අරුත හඟවයි. මෙම ක්‍රමය ජපන් රටෙහි භාවිතයට පැමිණ දැනට වසර 20 ක් පමණ වෙතැ යි දැක්වේ. ළමයින්ගේ කියවීම පිළිබඳ උනන්දුවක් දැක්වූ වැඩිහිටියනගේ අවධානය මෙම කරුණ කෙරෙහි වහා යොමුවිනි. ක්‍රම ක්‍රමයෙන් ස්වේච්ඡාවෙන් ම ජනයා තම අසල්වාසීන් උදෙසා මෙවන් පුස්තකාල සංවිධානයට උත්සුක වූහ.

ළමා පොත පත සම්පාදනය කළ ලේඛකයෝ නිරායාසයෙන් ම තමන් සතුව තිබූ විශාල ළමා පොත් එකතුවලින් ළමුන් සඳහා කියවීම පිණිස පොතපත ප්‍රදානයට පටන් ගති. ළමයින් ගේ පොතපත පිළිබඳ ප්‍රතික්‍රියා කවරාකාරදැ යි දැන ගැනීමේ ප්‍රථම තිවැරදි මූලාශ්‍රයක් වශයෙන් ඔවුනට ඉතාම වැදගත් සාධක සපයන්නක් විය.

---

වයස්ගත ගෘහිණියන් තම දරු දැරියන් වැඩිවිය පැමිණීමත් සමග හුදෙකලාව ගිය ළමා පොතපත හා තම මහලු වියෙහි ගෙවෙන විවේක කාලය මෙම ළමා පුස්තකාල සංකල්පය හා වහා එක්ව ගත්තෝය. එය මෙම වයස්ගත කතුනට යමක නිරතවීමේ අවස්ථාවක්සලසා දුනි; එය සමාජයේ වෙසෙන සෙස්සනට මෙහෙයක් කිරීමේ තෘප්තිය ලබා දුනි. විශේෂයෙන් ඉන් වැඩෙන ළමුනට සෙතක් අත් විය.

මේ අතරතුර තරුණ ගෘහපතිනියන්ට ද තමන් ගේ වැඩෙන දූ දරුවන් විෂයෙහි පැන නැග තිබුණා වූ හදිසි අවශ්‍යතාවක් වූ කියවීම සඳහා වඩාත් යෝග්‍ය ද්‍රව්‍ය සෙවිල්ල ඔස්සේ මෙම "බුන්කෝ" පුස්තකාල සංකල්පය වෙත ඇදී ආයේ නිරායාසයෙනි.

මෙම තරුණ මව්වරු පිරිස එක්වගෙන කණ්ඩායමක් ද පිහිටුවා ගත්තෝය. ඔවුන් සෑවොම කුඩා මුදල් සම්මාදමක් මගින් එකතු කර ගත් මුදලින් එක්ව, තම ළමුන් සැමගේ පරිහරණය සඳහා පොත් මිල දී ගැනීමට ද සමත් වූහ. එය සමුපකාර පදනමකින් යුතුව, දරු දැරියනට උවමනා හොඳ පොතපත මිල දී ගැනීමෙහි මහඟු ප්‍රයත්නයක් විය. රජයේ නිවාස යෝජනා ක්‍රමයක මෙවන් කණ්ඩායමක් එක් වූ කල්හි, නිදසුනක් වශයෙන් මෙසේ සම්මාදම් කර ගත් අරමුදල පුද්ගලික නිවාසයක තැන්පත් කරනු වෙනුවට, එය ප්‍රජා මණ්ඩල කාර්යාලයේ තැන්පත් කිරීමෙන් පුස්තකාලයට වඩා මහජන ආයතනයක ස්වරූපය දීමෙහි උපස්ථම්භක වූවා සේ විය.

පුද්ගලික නිවාසයක පිහිටුවා නොතිබුණා වුද, පාලනය පැහැදිලි වශයෙන්ම පුද්ගලික මට්ටමකින් නොපැවතියා වුද, පුස්තකාලය "චික්කි බුන්කෝ" නොහොත් ප්‍රජා පුස්තකාලයක් ලෙසින් හඳුන්වන්නට යෙදිණ. එසේද වුවත්, එම පුස්තකාලය තම අවශ්‍යතා පිළිබඳ සවිඥානකත්වයකින් යුතු වූ පුද්ගලයින් විසින් මුදල් හදල් යොදන ලද්දා සේම, ස්වේච්ඡාවෙන් ඔවුන් විසින් පාලනය කරන ලද්දේ ද විය.

ඉක්මණින්ම ප්‍රාථමික සහ පූර්ව පාසල් මගින් මේ ආකාරයේ පුස්තකාලය සංවර්ධනය පටන් ගන්නා ලදී; මේවා "එන් බුන්කෝ" නොහොත් ප්‍රාථමික පුස්තකාල වශයෙන් හඳුන්වන ලදී. බෞද්ධ පන්සල් ආරාම, ක්‍රිස්තියානි පල්ලි ද මෙම ව්‍යාපාරයට අනතුරුව එක්විණ. ඉරිදා ඉස්කෝලවලට පැමිණි ළමුන් සඳහා තමන්ගේ ම පුස්තකාල ඔවුන් විසින් අරඹන ලදී.

මෙසේ රට පුරාම "බුන්කෝ" පුස්තකාල ක්‍රමය ගැන මෙන්ම, ළමයින් ගේ කියවීමේ රුචිය පිළිබඳව ද උනන්දුවක් වර්ධනය වූයේය. මෙහි ප්‍රතිඵලය වූයේ මහජන පුස්තකාල දියුණුව ද වේගවත් වීම යි. නව මහජන පුස්තකාල ළමා සේවාවන් පිළිබඳ එල්ලය ඇතිව පුද්ගලික නොවන, පොදු අභිප්‍රායක් ඇතිව එවැනි පොතපත සඳහා මුදල් ප්‍රතිපාදන ඇති කල්හි, මව්වරුනට "බුන්කෝ" පුස්තකාලයක් ආරම්භ කිරීමට ධෛර්යය දෙනවාත් හැර, ඔවුනට උවමනා පොතපත සපයා දීමට ද පොරොන්දු වීම ද සිදුවේ. මෙසේ මහජනාධාර වලින් යැපෙන, එහෙත් පුද්ගලිකව පවත්වා ගෙන යන එවැනි පුස්තකාල මහජන පුස්තකාල සේවා ඒකක වශයෙන් වර්ධනය කෙරේ. ඇත්ත වශයෙන් එවැනි මව්වරුන්ගේ උද්‍යෝගීමත් ව්‍යාපාර නිසාම තම ජන කොට්ඨාශයට ශාඛා පුස්තකාලයක් ලබා ගැනීමෙහි සමත් අවස්ථා ද දක්නට ලැබිණ.

දැනට රට පුරාම මෙවැනි විවිධ "බුන්කෝ" පුස්තකාල 4000 ක් පමණ ඇතැ යි පැවසේ. එය ප්‍රමාණානුකූලව කොතරම්දැ යි කිවහොත්, ළමයින්ට මහජන පුස්තකාල මගින් පිරිනමන සේවාවන් මෙන් හත් ගුණයක් පමණ වෙතැ යි මෙහි ලා සඳහා කිරීම වටනේ ය.

ජපානයෙන් පරිබාහිර ලෝකයේ බොහෝ ජනයා ද ළමයින් සඳහා වන මෙවන් පුද්ගලික කුඩා පුස්තකාල සංකල්පය කෙරේ බෙහෙවින් සිත් ඇදී ගොස් ඇති බව පෙනී යයි. ස්වභාවයෙන් ම මහජන පුස්තකාල සේවා සංවර්ධනය කිරීමට ඇති රටවල ජනයාට වඩාත් ම අදාලත්වයකින් යුතු වූවකි, මෙම සංකල්පය. මක්නිසා ද යත්, ඔවුන්ගේ පුරෝගාමීත්වයෙන්ම ඇරඹිය හැකි නිසාම ය. එපමණක් ද නොව, එය ළමයින් මෙන්ම, වැඩිහිටියන් උදෙසා ද දියුණු කළ හැකි ප්‍රබෝධකයක් පමණක් නොව, කියවීමට පෙළඹවීමට හා හොඳ පොතපතෙහි අවශ්‍යතාවත්, ළමයින් වෙනුවෙන් කැප වූ පුස්තකාල සේවාවක් පිළිබඳ අත්‍යවශ්‍ය භාවයත් අවබෝධ කිරීමෙහි සමත් වන්නකි.

ජපානයේ මෙවන් පුද්ගලික පුස්තකාල සේවාවක් වැඩි වැඩියෙන් ව්‍යාප්ත වීම එරටෙහි ළමයින් හා ඔවුන්ගේ පුස්තකාල, ළමයින්ගේ පොතපත පිළිබඳව උද්ගතව ඇති විවිධ ගැටළු විෂයයෙහි අවසාන විසඳුමක් නොවතුදු, මෙම "බුන්කෝ" පුස්තකාල සංකල්පය සමහරක් රටවල ට තදින් ම ගලපා ගත හැකි බව පෙනේ. එය ළමයින් ගේ පොතපත හා ඔවුනට ම කැප වූ පුස්තකාල සේවාවක වැඩි දියුණුව සඳහා තබන පළමු පියවරක් වශයෙන් දැක්විය හැක.

---

(පරිවර්තනය : පියසේන වික්‍රමගේ)

---

## අඩ අඳුරේ පතපොත කියවීම

(නවදිල්ලියෙන්)

අඩ අඳුරේ පතපොත කියවීමෙන් ඇස් අමාරු සෑදේ යයි පවතින විශ්වාසය පදනම් රහිත එකක් බව ඔක්ස්පර්ඩ් විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ඩී. විටර්පී පවසයි. කෙසේ වෙතත්, එක ඇසකින් පමණක් බැලීම දීර්ඝ කාලීන වශයෙන් අහිතකර අතර, ළමා වියේදී ඈවුරුද්දක් තුළ කිසියම් ඇසකින් හරියාකාර ප්‍රයෝජන නො ගත්තොත්, ඒ ඇස හා මොළයද අතර ස්නායු සම්බන්ධය කැඩී යන බවත්, මහාචාර්යවරයා කියා සිටී. (සමාචාර)

## විවිධ ප්‍රවෘත්ති

### පොත් සතියට
### පුස්තකාල මණ්ඩලයේත් සහයෝගය

ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය මගින් පැවැත්වීමට සැලසුම් කර ඇති "ජාතික පොත් සතියේ" පැවැත්වීමේ කටයුතුවලට ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයද සහයෝගය ලබා දීමට නියමිතය.

මුල් වරට මේ වසරේදී පොත් සතිය පැවැත්වීමට නියමිත අතර, ඉන්පසු අවුරුදු පතා නොකඩවා එම වැඩ පිළිවෙල පවත්වාගෙන යාමට අපේක්ෂා කෙරේ.

මහජනයාගේ පොත් කියවීමේ පුරුද්ද වර්ධනය කිරීම, පොත් අලෙවිය වැඩි කිරීම, ලේඛකයන්ට අත දීම ආදි පරමාර්ථ මෙමගින් ඉටු කර ගැනීමට අපේක්ෂිත බව ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලයේ ලේකම් නිශ්ශංක මදුරප්පෙරුම මහතා පවසයි.

සම්මන්ත්‍රණ, පොත් ප්‍රදර්ශන, රචනා තරග ජනතාවට අඩු මිලට ආදි විශේෂාංග මෙයට ඇතුළත් වනු ඇත.

### ගමේ පාසලට වැඩියෙන් පොත්

ගම්බද කුඩා පාසල් දියුණු කිරීමේ පියවරක් වශයෙන්, එම පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අතිරේක කියවීම් සඳහා පොත්පත්, පුවත්පත්, සඟරා ආදිය වැඩි වැඩියෙන් සැපයීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු යොදා තිබේ.

ශිෂ්‍ය ශිෂ්‍යාවනට අවශ්‍ය තරම් අතිරේක පොත්පත්, පුවත්පත්, සඟරා ආදිය නොතිබීම මෙම පාසල් දියුණු කිරීමට ප්‍රධාන බාධකයක් බව පරීක්ෂණයෙකදී පෙනී යාම නිසා අමාත්‍යාංශය මෙම පියවර ගෙන තිබේ.

මේ සඳහා මහජනතාවගේද සහයෝගය ලබාගෙන කටයුතු කිරීමට යෝජිතය.

කුඩා පාසල් දියුණු කිරීම සඳහා එම අමාත්‍යාංශයෙහි කුඩා පාසල් ඒකකය නමින් වෙනම අංශයක්ද පිහිටුවා ඇත. (දිනමිණ 15.2.77)

### අප්‍රේල් කැරැල්ල නඩුවේ
### මුල් පොත

(කොළඹ)

අප්‍රේල් කැරැල්ල පිළිබඳ නඩු විභාග කළ අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා වාර්තාවේ පළමුවැනි කොටස දැනට මුද්‍රණය කර හමාර වී ඇති අතර, එය රජයේ ප්‍රකාශන අංශයේ විකිණීමට තබා ඇත.

පිටු 445 කින් යුක්ත මේ වාර්තාවේ ඉංග්‍රීසි මුද්‍රණය පමණක් දැනට අවසන් වී ඇති අතර, සිංහල පිට කිරීමට තව සති කීපයක් ගත වනු ඇතැයි දැන ගන්නට තිබේ.

### දිසාවක් පාසා
### හොඳ පොත් ගුල්

(කොළඹ)

හැම දිස්ත්‍රික්කයකටම අඩු වශයෙන් එක අංග සම්පූර්ණ පුස්තකාලයක්වත් ලැබෙන අන්දමට රටපුරා පුස්තකාල 25 ක් පිහිටුවීමට පළාත්පාලන දෙපාර්තමේන්තුව ක්‍රියා කරගෙන යයි.

මේ සඳහා වැඩ පිළිවෙලක් සකස් කර තිබෙන අතර, මෙම වැඩ පිළිවෙල ඉක්මනින් ක්‍රියාත්මක කෙරෙන බව පළාත්පාලන දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරියෙක් පැවසීය. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේද සම්බන්ධය ඇතිව මෙම වැඩ පිළිවෙල ක්‍රියාත්මක කෙරෙන බව පැවසූ මෙම නිලධාරියා, උසස් අධ්‍යාපනය ලබන අයට ප්‍රයෝජන ලැබෙන අන්දමින් මේ පුස්තකාල සංවිධානය කෙරෙන බවද කීය. (සිළුමිණ 23.1.77)

## බදුල්ල මහජන පුස්තකාලයේ දියුණුව ලක්ෂ එකහමාරක්

බදුල්ල නගරයේ සෙනරත් පරණවිතාන අනුස්මරණ මහජන පුස්තකාලය දියුණු කිරීමට මේ වසරේදී බදුල්ල නගර සභාව රුපියල් 1,62,000/- ක මුදලක් වැය කරනු ඇත.

පුස්තකාල ගොඩනැගිල්ලේ ඉඩ ප්‍රමාණය වැඩි කරනු සඳහා රුපියල් 85,000/= ක වියදමින් ඉදි කරන ශාලාවේ වැඩ කටයුතු සෑහෙන ප්‍රමාණයකින් නිමාවට පත්ව ඇත. අවශ්‍ය උපකරණ සකස් කිරීම සඳහා රුපියල් 15,000/= ක මුදලක් වෙන් කොට ඇති අතර, අළුතෙන් පොත් මිලදී ගැනීම සඳහා වෙන්ව ඇති මුදල 10,000 කි. පුස්තකාල සේවා පවත්වා ගෙන යාම හා වැඩි දියුණු කිරීම සඳහා රුපියල් 52,000 ක් වෙන් කොට තිබේ.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ 1976 වර්ෂයේ මහජන පුස්තකාල සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ ද සංවර්ධනය කරනු ලැබූ මෙම පුස්තකාලයට රුපියල් දහසක් වටිනා පොත් ආධාර යක්ද ප්‍රදානය කරන ලදී.

දැනට මෙම පුස්තකාලයේ කියවීම් ශාලාවක්, බැහැර දෙන අංශයක්, විමර්ශන අංශයක් හා ළමා අංශයක්ද පිහිටුවා ඇත. විවිධ ආයතන හා සංවිධාන මගින්ද පසුගිය වසරේ දී විශාල වශයෙන් ආධාර පරිත්‍යාග ලැබී ඇති අතර, නාගරිකයේ අරමුදලින් රුපියල් තුන්දහසක් හා පළාත් පාලන දෙපාර්තමේන්තු වෙන් රුපියල් දෙදහසක් ද පොතපත මිලදී ගැනීමට වැය කර ඇති බව දැක්වේ.

බදුල්ල නාගරිකයේ විශේෂ කොමසාරිස් එච්.එම්. අබේපාල මහතා මේ පිළිබඳ විශේෂ උනන්දුවකින් ක්‍රියා කරන බව වාර්තා වේ.

## මහජන පුස්තකාලයක් විවෘත කරයි.

මහවැව නව මහජන පුස්තකාලය නියෝජ්‍ය පළාත් පාලන ඇමති ඇල්. ජයසේන මහතා අතින් ජනවාරි මස 31 වන දින විවෘත කිරීමට නියමිතව තිබූ බව වාර්තාවක කියැවේ.
(ලංකාදීප - 1977.01.29)

## දිවුලපිටිය ආසනයේත් නව මහජන පුස්තකාලයක්.

දිවුලපිටිය ආසනයේ බඩල්ගම නගරයේ කෙහෙල්ඇල්ල ගම්සභාව මගින් ඉදි කරන ලද නව මහජන පුස්තකාලය පෙබරවාරි 03 වන දින උදේ 9.00 ට දිවුලපිටිය මන්ත්‍රී රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ නියෝජ්‍ය ඇමති ලක්ෂමන් ජයකොඩි මහතා අතින් විවෘත කිරීමට නියමිතව තිබිණි.

මෙම පුස්තකාලය කෙහෙල්ඇල්ල විවිධ සේවා සමුපකාර සමිතිය මගින් ඉදි කරන ලද අතර, ඒ සඳහා ගම් සභාව මගින් රුපියල් විසිඅට දහසක මුදලක් වැය කරන ලද බව ද සඳහන් වේ.
(දිනමිණ - 1977.02.04)

## පුස්තකාලයේ වැඩ කඩිනම් කරයි.

කෝට්ටේ මන්ත්‍රී කථානායක ස්ටැන්ලි තිලකරත්න මහතාගේ යෝජනාවක් අනුව කෝට්ටේ විශේෂ කොමසාරිස් කාර්යාලය මගින් නුගේගොඩ චැපල් පටුමගේ රුපියල් ලක්ෂ දහයක් වැය කර ඉදි කරන තෙමහල් පුස්තකාලයේ වැඩ කටයුතු මේ දිනවල කරගෙන යනු ලැබේ.
(දිනමිණ - 1976.07.15)

## ප්‍රාදේශීය පුස්තකාල වාර්තාවලින්. . .

### ඌරුවල් පේරුව ගම්සභා මහජන පුස්තකාලයට රුපියල් දසදහසක් !

මෙතෙක් පුස්තකාල පහසුකම් නොතිබුණු ඌරුවල්පේරුව ගම්සභා ප්‍රදේශයේ නව මහජන පුස්තකාලයක් පිහිටුවීමට ඌරුවල්පේරුව ගම්සභා-වේ විශේෂ කොමසාරිස් සහ මහර උප දිසාපති සිරිමත් ගුණරත්න මහතා කටයුතු යොදා ඇති අතර, ඒ සඳහා නව ගොඩනැගිල්ලක් තැනීමේ වැඩද අවසන් වෙමින් පවතී.

එය මාර්තු මස අවසානයේ පමණ විවෘත කිරීමට අපේක්ෂිත අතර, එහි වැඩ කටයුතු සඳහා රුපියල් දසදහසක පමණ මුදලක් වැය වනු ඇතැයි ගණන් බලා තිබේ.
(දිනමිණ - )

### කෙසෙල්වත්ත සු.න.ස. මහජන පුස්තකාල ගොඩනැගිල්ල නිමවේ

කෙසෙල්වත්ත සුලුනගර සභා මහජන පුස්තකාල ගොඩනැගිල්ල රුපියල් තිස්දහසක වියදමින් දැන් සාදා අවසාන කර ඇති බව වාර්තා වෙයි.

1975 මහජන පුස්තකාල සංවර්ධන වැඩ පිළිවෙල යටතේ සංවර්ධනය කිරීමටද පුස්තකාල සේවා මණ්ඩලය මඟින්ද තෝරාගෙන තිබූ මෙම මහජන පුස්තකාලයට මණ්ඩලය මඟින් රුපියල් දහසක් වටිනා පොත් ආධාරයක්ද ප්‍රදානයට නියමිතව ඇත්තේය.

ගොඩනැගිල්ල තැනීම සඳහා රුපියල් දසදහසක් පළාත්පාලන අමාත්‍යාංශයෙන්ද, පොත්පත් මිලදී ගැනීම සඳහා පළාත්පාලන කොමසාරිස්වරයා විසින් රුපියල් පසළොස්-දහසක මුදලක්ද කෙසෙල්වත්ත මහජන පුස්තකාලයට ආධාර වශයෙන් ලැබී ඇත.

### විජයරාජ පළාතේ ජනතාවට නව මහජන පුස්තකාලයක්

රුපියල් දසදහසක වියදමින් විජයරාජ පළාතේ ජනතාව උදෙසා කරුවල ගස්වැව විජයරාජ පළාත ගම්සභා කාර්යාලය අබියස ඉදි කරන ලද නව මහජන පුස්තකාල ගොඩනැගිල්ල විජයරාජ පළාත ගම්සභාපති ලැම්බට් මොරමුදලිනමහතා විසින් විවෘත කරන ලදී. (දිනමිණ - )

### රුවන්පුරප්පින් නව මහජන පුස්තකාල ගොඩනැගිල්ලක්

රත්නපුර දිසාපති මන්දිර භූමිය තුළ රුපියල් පන්ලක්ෂයක වියදමින් ඉදි කිරීමට යෝජිත නව තෙමහල් මහජන පුස්තකාල ගොඩනැගිල්ල ඉදි කිරීමේ වැඩ කටයුතු දැන් අරඹා ඇත.
(ලංකාදීප - 22.1.77)

### උඩබුලත්ගමපස්බාගේ කෝරළේ ගම්සභා පුස්තකාලයේ ළමා අංශය පටන් ගනියි

උඩබුලත්ගමපස්බාගේ කෝරළේ ගම්සභා මහජන පුස්තකාලයේ ළමා අංශය පළාත් පාලන නියෝජ්‍ය ඇමති ඇල්.බී.ජයසේන මහතා විසින් පෙබරවාරි 4වන දින විවෘත කරන ලදී.
(මහනුවර)

"පුස්තකාල අනාගත පූජනීය ස්ථානයයි. . .!!"

-බටහිර ලේඛකයෙක්.

සංස්කාරකට ලියුම්

බදුල්ල
ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්
ටී.අයි.කමල්දීන්
ලියයි.

බදුල්ල දිස්ත්‍රික්කයේ පුස්තකාල සේවා :

බදුල්ල දිස්ත්‍රික්කයේ 1976 අන්තර් පුස්තකාල පොත් හුවමාරු ක්‍රමය යටතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් රුපියල් හයදහසක් වෙන් කර ඇත. ප්‍රදේශයේ මහජන පුස්තකාල අතර පොත් හුවමාරුකිරීමේ මෙම වැඩ පිළිවෙල මේ මස අගදී ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත. 1977 වර්ෂය සඳහා අන්තර් පොත් හුවමාරු ක්‍රමයට බදුල්ල දිස්ත්‍රික්කයට රුපියල් දහතුන්දහසක් වෙන් කර ඇති අතර, එම මුදලින් පොත් ලබා ගැනීම ශීඝ්‍රම ඉක්මනින් සිදු කරනු ලැබේ.

1976 වර්ෂයේදී ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් බදුල්ල දිස්ත්‍රික්කයේ පුස්තකාල සංවර්ධනයට විශාල සේවයක් සිදු කර ඇත.

මෙම සංවර්ධන වැඩ පිළිවෙල යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ මහජන මන්ත්‍රී කොට්ඨාශ අටෙන් එක් කොට්ඨාශයකින් එක් මහජන පුස්තකාලයකුත්, එක් පාසල් පුස්තකාලයකුත් වශයෙන් සංවර්ධනය සඳහා තෝරා ගනු ලැබිය.

බදුල්ල, පස්සර, වැලිමඩ, හපුතලේ, බණ්ඩාරවෙල, සපුගොල්ල කිරවනාගම, ඌව බින්තැන්න, හාලි ඇල, යන මහජන පුස්තකාලත්, පාසල් පුස්තකාල වශයෙන් බදුලු මහා විද්‍යාලය, දික්වැල්ල මහා විද්‍යාලය, බණ්ඩාරවෙල මහා විද්‍යාලය, හපුතලේ මහා විද්‍යාලය, මහියංගන මහා විද්‍යාලය, පස්සර මහා විද්‍යාලය, අල්ලදාන් මහා විද්‍යාලය හා බත්මැඩිල්ල මහා විද්‍යාලය යන පාසල් පුස්තකාලත් මෙසේ පුස්තකාල සංවර්ධනයට තෝරා ගනු ලැබිය.

මේ පුස්තකාලවල පරිග්‍රහණ ලේඛන පිළියෙල කිරීම, පොත් වර්ග කිරීම, සූචි පත්‍රිකා ලිවීම, පුස්තකාලයාධිපතීන් පුහුණු කිරීම හා වෙනත් පුස්තකාල සංවර්ධනයට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

එමෙන්ම, ඉහත සඳහන් සියලුම පුස්තකාලයන් වෙත ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් රු.1000/= බැගින් වටිනා පොත් කට්ටලය බැගින් ප්‍රදානය කරනු ලැබිය.

සපුගොල්ල කිරවනාගම නව මහජන පුස්තකාල ගොඩනැගිල්ල රු.35,000/=ක මුදලකින් තනා අවසන් කර ඇති අතර, එය අප්‍රේල් මාසයේදී විවෘත කිරීමටද බලාපොරොත්තු වේ.

ඌව බින්තැන්න ප්‍රදේශයට විශාල අඩුපාඩුවක්ව තිබූ නව මහජන පුස්තකාලයක් තැනීමට රු.52,000/=ක මු දලක් වෙන් කර ඇත.

මේ හැරෙන්නට රිල්පො, හපුතලේගම, මහජන පුස්තකාල සෑනට තනා අවසන් වෙමින් වෙමින් පවතින අතර, බදුල්ල මහජන පුස්තකාලය විශාල කිරීම සඳහා පුස්තකාලයට යාබදව තවත් ගොඩනැගිල්-ලක් තනා අවසන් වෙමින් පවතී.

බදුල්ලේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ සභාපතිත්වයෙන් දිස්ත්‍රික්කයේ පුස්තකාල සංවර්ධනය කිරීම සඳහා පුස්තකාල කමිටුවක් පත් කර ඇති අතර, සෑම මාසයක් තුළම කමිටුවේ රැස්වීම් පවත්වා දිස්ත්‍රික්කයේ පුස්තකාල සංවර්ධනය සඳහා වැදගත් තීරණ ගෙන, එම තීරණ ඉක්මනින්ම ක්‍රියාවට නගනු ලැබේ. මෙම කමිටුව ඌව ප්‍රදේශයේ පුස්තකාල සංවර්ධනයට බොහෝ සෙයින් ඉවහල් වී ඇති බව පෙනේ.

Dl 1752

**පුවත් කඩිත්තෙන්...**

## අනුපමේය අත් පිටපත් ගබඩාව

(ලෙනින්ග්‍රෑඩ්)

මහා පීටර් නමැති රුසියානු අධිරාජයාගේ නියෝගයක් අනුව, 1714 දී පීටර්ස්බර්ග් - (දැන් ලෙනින් ග්‍රෑඩ්) ගිම්හාන මාලිගයේ පොත් ස්වල්පයකින් රුසියාවේ ප්‍රථම පුස්තකාලය පාඨකයන් සඳහා විවෘත කරන ලදී. දැන් එහි පොත් එක් කෝටි පනස් ලක්ෂයක් පමණ ඇති අතර, එය හඳුන්වනු ලබන්නේ සෝවියට් සංගමයේ විද්‍යා ඇකඩමි - යේ පුස්තකාලය යනුවෙනි. එය දැන් සමස්ත ලෝකයේම ප්‍රසිද්ධියට පත්ව ඇත.

සවන සියවසේ සිට දහඅට වන සියවස දක්වා වූ ග්‍රන්ථ හා අත් පිටපත් එම එම පුස්තකාලයේ වැදගත්ම අංශයක් වේ. එහි ඇති ප්‍රමාණය නියත වශයෙන්ම වැඩිවේ. සෑම වසරකදීම පැරණි පොත් හා අත් පිටපත් සොයමින් විද්‍යා ඇකඩමියේ පරීක්ෂණ අංශ සෝවියට් සංගමයේ සෑම කෙළවරකටම පිටත් වී යයි.

අත තැබූ විට කැබලිවලට කැඩී යන තරම් පැරණි පොත් පුස්තකාලයේ ප්‍රති- සංස්කරණය අංශයට ඇතැම් විට ලැබේ. සියවස් ගණනක් එකට තිබීම නිසා, ඇතැම් පොත්වල පිටු එකට ඇලී ලී කැබැල්ලක් මෙන් පෙනේ. අධි සංඛ්‍යාත ධාරා විද්‍යාගාරයේදී එසේ එකට ඇලුණු පිටු වෙනු කරනු ලැබේ. මැකී ගිය අකුරු හා චිත්‍ර ප්‍රකාශ - විශ්ලේෂණ මගින් අනාවරණය කරයි.

වත්මන් ප්‍රකාශන සඳහා අලුත් වර්ගයේ කඩදාසි භාවිතා කිරීමට විද්‍යාගාරයේ කාර්ය මණ්ඩලය විසින් නිර්දේශ කොට ඇත. එම කඩදාසිවල මුද්‍රිත ලියවිලි, ග්‍රන්ථ, සඟරා හා චිත්‍ර අවුරුදු 1000 ක් පවතිනු ඇත.

(සෝවියට් දේශය - 1976/අංක: 11 - 159)

## ප්‍රංශයේ පාෂාණ පුස්තකාලයක්

(බ්‍රිටනි)

භූ විද්‍යාත්මක හා පතල් පිළිබඳ පර්යේෂණ කාර්යාංශය සහ සාගර සම්පත් උපරිම වශයෙන් ලබා ගැනීම පිළිබඳ ජාතික මධ්‍යස්ථානය මගින් තොබෝදා මුහුදින් ලබා ගත් ආදර්ශයන්ගෙන් යුතු පාෂාණ පුස්තකාලයක් ප්‍රංශයේ බ්‍රිටනි සාගර විද්‍යා මධ්‍යස්ථානයේදී පිහිටුවනු ලැබිය. මේ පියවර වූකලී පුස්තකාලය යනුවෙන් හැඳින්වෙන්නේ පොතපත හා වෙනත් කියවීම් ද්‍රව්‍ය, ශ්‍රව්‍ය- දෘෂ්‍ය උපකරණ පමණක් ඇති මධ්‍යස්ථානයක් පමණක් නොව, නූතන විද්‍යාත්මක හා කාර්මික ප්‍රගතිය තුළින් වඩාත් පුළුල් අරුත් නංවන්නක් බව - ට කෙමෙන් විකාශනය වීමේ හොඳම සාධකයක් බවද සඳහන් කළ මතය.

මෙම නව පුස්තකාලය මගින් සාගර පත්ලේ හා හැකිතාක් දුරට භූ විද්‍යාත්මක අගයෙන් යුතු ප්‍රදේශවලින්ද සොයා ගත හැකි භූ විද්‍යාත්මක හා කාර්මික ක්ෂේත්‍රවලට අයත් ආදර්ශකත් ආරක්ෂා කිරීම, සුදුසු පරිදි සංරක්ෂණය, සංවිධානය ආදියද කරනු ඇත. මෙම පුස්තකාලය මීටර් 1000 ක ප්‍රමාණයෙන් යුතු වායු සමීකරණය කළ ගොඩනැගිල්ලක පිහිටා ඇත. මුහුදු පත්ලින් ලබා ගත් 30000 කට අධික සංඛ්‍යාවක් වන ආදර්ශ පාෂාණවලින් යුතු මෙම පුස්තකාලයේ එම වස්තූන් පිළිබඳ පරීක්- ෂණ පැවැත්වීම සඳහා රසායනාගාරයක්ද ඇත.

පුස්තකාල ප්‍රවෘත්ති - 1977 ජනවාරි/මාර්තු

පුවත් කඩිත්තෙන්...

## තුන්වන ලෝකයේ රටවල පොත් දැක්මක්

(ලන්ඩන්)

"තුන්වන ලෝකයේ සහ තුන්වන ලෝකය සඳහා වන පොතපත" පිළිබඳ එක් දින ප්‍රදර්ශනයක් පෙබරවාරි පළමුවන දින ලන්ඩන් විශ්ව විද්‍යාලයේදී පැවැත්වීමට නියමිතව තිබිණි.

පොතපත ප්‍රකාශකයින් 26 දෙනෙකු මේ සඳහා සහභාගිවීමට වීමට නියමිත වූ අතර ඔවුන් විසින් සංවර්ධනය වන ලෝකයේ රටවල් සඳහා විශේෂයෙන් සැලසුම් කරන ලද නවතම ප්‍රකාශන මෙහිදී ප්‍රදර්ශනය කෙරේ. ඒ අතර විදේශවලින් පැමිණෙන පාසල් ළමුන්, ශිෂ්‍යයින් හා උපාධි අපේක්ෂකයින් සඳහා වන පොතපතද ප්‍රදර්ශනයට ඇතුළත් වනු ඇත.

ලන්ඩන් විශ්ව විද්‍යාලයේ සංවර්ධනය වන රටවල අධ්‍යාපන අංශය විසින් මෙම ප්‍රදර්ශනය සංවිධානය කර ඇත. තුන්වන ලෝකයේ රටවල පොතපත රාශියක්ද මෙම ප්‍රදර්ශනයට ඇතුළත්ව ඇත.

මෙම ප්‍රදර්ශනය සංවිධානය කළ එම විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන අංශයේ ආර්. [illegible]ර් මහතා පවසන අන්දමට දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් පසුව සංවිධානය කරන ලද 25වන ප්‍රදර්ශනය මෙය වේ. ප්‍රාථමික වශයෙන් මෙබන් ප්‍රදර්ශනයක අරමුණ වූයේ සංවර්ධනය වන රටවල සේවය සඳහා ඔන ගුරුවරුන්ට සහ ශිෂ්‍යයින්ට ලබා ගත හැකි පොතපත හා ඒවා ලබා ගත හැකි ස්ථාන පිළිබඳ පෙන්වා දීම බවත්, ඔහු විසින් වැඩි දුරටත් පවසා ඇත.

## තෙත පොත් වේලන අලුත් ක්‍රමයක් !

(කොලෝන්)

තෙත් කැවුණු පතපොත සහ ලිය කියවිලි සාර්ථක ලෙස සහ අඩු වියදමකින් අභ්‍යවකාශ ගමන් පුහුණු වන වැකුම් කාමරවලදී වේලා ගැනීමට පුළුවන් බව කොලෝන් නුවර අභ්‍යවකාශ පර්යේෂණායතනයෙන් වාර්තා වේ.

ජල ගැලීම්වලින් හෝ ජල නළ පිපිරී යෑමෙන් හෝ වටිනා ලියකියවිලි, ඇතැම් විට පුස්තකාලවල ඇති පොත් සම්පූර්ණ තොග තෙත් කැවී යන බව වාර්තා වෙයි. එවැනි අවස්ථාවලදී එම ලිය කියවිලි හෝ පොත් සාමාන්‍ය ක්‍රමයට වේලා ගැනීමට බෙහෙවින් මුදල් වැයවේ. එමෙන්ම එම ක්‍රමයේ සාර්ථකභාවය ගැනද විශ්වාසයක් තැබිය නොහැකිය. එහෙත් නූතන වැකුම් ජල ඉවත්කරණයක් මගින් එම කාර්යය සාර්ථක ලෙසත්, අඩු වියදමකිනුත් කළ හැකි බව සොයා ගෙන තිබේ.

විද්‍යාඥයන් නොයෙකුත් වර්ගවල තෙත් කඩදාසි එම යන්ත්‍රයෙහිලා වේලාගෙන ප්‍රතිඵල පරීක්ෂා කර ඇත. යන්ත්‍රයේ වේලා ගත් කඩදාසිවලට කිසිම හානියක් සිදුවී නොතිබුණි. මෙම යන්ත්‍රයෙන් වේලා ගැනීමෙන් පසුව තෙත් කැවුණු පොත්වල පිටු එකින් එක කිසිම අපහසුවක් නැතිව පෙරළීමටද හැකි විය. (ලංකාදීප - 17.1.77)

## රජයේ ලිපි කියවන්න අවසරයක්

(කැන්බරා)

රජයේ දෙපාර්තමේන්තුවල හා නිලධාරීන් ළඟද ඇති රජයේ ලිය කියවිලි කියවා බැලීමට පොදු ජනතාවට නිදහස ලබා දෙන පණතක් ඕස්ට්‍රේලියානු රජය විසින් පාර්ලිමේන්තුවට ළඟදීම ඉදිරිපත් කිරීමට නියමිතය. (ඒ.අයි.ඇස්.)

---

A man will turn over half a library to make one book.

Dr Samuel Johnson

1709 - 1939

දිවයිනේ අංග සම්පූර්ණ

## මහජන පුස්තකාල ලේඛනයක්

පළාත් පාලන කොමසාරිස්තුමාගේ සහ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන්ගේ සහයෝගය ඇතිව, දිවයිනේ විවිධ පළාත් පාලන ආයතන මගින් පවත්වාගෙන යනු ලබන මහජන පුස්තකාලයන්හි අංග සම්පූර්ණ ලේඛනයක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් දැන් පිළියෙල කර හමාර වී ඇත.

මෙතෙක් කිසිදු අයුරකින් සංග්‍රහ කර නොතිබූ මෙම පුස්තකාල ලේඛනය, පළමුවන වරට එම තොරතුරු ඒකරාශී කිරීම සඳහා පුස්තකාල මණ්ඩලයෙන් ඉටු කළ වැදගත් මෙහෙවරක් හැටියට සැලකිය හැකිය. මෙහි පිටපත් අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ලැබීමට සලස්වා ඇති අතර, මෙම කෘතිය වාර්ෂික ග්‍රන්ථයක තත්වයට පත් කරනු සඳහා වසරක් පාසා සංස්කරණයටද කටයුතු යොදා ඇත.

මේ සඳහා ඇසුරු කළ/මූලාශ්‍රයන් කෙළින්ම ලබා ගත් නිරවද්‍ය තොරතුරු වන හෙයින්, එම ලේඛනය සාධිකාරිත්වයෙන්ද පිළිගත හැකි මට්ටමක පවතින බවද සඳහන් කළ යුතුවේ.

මේ හැරුණ විට, මණ්ඩලය මගින් ඒ ඒ මහජන පුස්තකාලයන්හි තත්ව සමීක්ෂණයක්ද මෙම වැඩ පිළිවෙල යටතේ කරගෙන යනු ලැබේ. පුද්ගලික මට්ටමින් මහජන පුස්තකාලයන්ගෙන් තොරතුරු ලබාගෙන ඒකරාශී කිරීමෙන් අනතුරුව විස්තරාත්මක නාමාවලියක් සැකසීමටද අපේක්ෂා කෙරේ.

මහජන පුස්තකාල පරිහරණයට

## දශම වර්ගීකරණයේ සංක්ෂිප්ත කෘතියක්

මහජන පුස්තකාලයන්හි ප්‍රයෝජනය සඳහා අත්‍යවශ්‍ය වන ඩිවි දශම වර්ගීකරණයේ නෙවන සාරාංශයේ සිංහල පරිවර්තනය සහිත සංස්කරණයක් දැන් පුස්තකාල සේවා මණ්ඩලය මගින් පිළියෙල කර අවසාන වෙමින් පවතී. පළමුවෙන් පුස්තකාල සේවින් සඳහා සේවාස්ථ පුහුණුවට ඉවහල් කර ගත් මෙම කෘතිය මෙවර සංශෝධන සහිතව ප්‍රකාශයට පත් කෙරේ.

මෙම ප්‍රකාශනය ලබා ගත හැකි ආකාරය ලබන වර පුස්තකාල ප්‍රවෘත්ති කලාපය බලනු මැනවි.

## ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය

මහජන පුස්තකාල,
විශ්ව විද්‍යාල පුස්තකාල,
පාසල් පුස්තකාල,
විශේෂ පුස්තකාල,
ළමා පුස්තකාල,

සාමාන්‍ය පාඨකයා,
විමර්ශණ අවශ්‍යතා,
පර්යේෂණ කටයුතු සඳහා,
සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පොත් පත් තෝරා ගැනීමට,
ශ්‍රී ලංකාවේ ප්‍රකාශන පිළිබඳ නිවැරදි තොරතුරු දැක්වෙන
ප්‍රධාන ජාතික ප්‍රකාශනය වන,

**ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය**
අත්‍යවශ්‍ය වේ.

සම්පාදනය සහ ප්‍රකාශනය:
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
72, බෞද්ධාලෝක මාවත,
කොළඹ - 04.

ටෙලි: 82243.

National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07

2. Date Scanned : 2017/10/13

3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara

4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : ...

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ...

Date : 2017/10/13

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*